**2021 දෙසැම්බර් මස 21 වන දින පැවති**

**හතළිස් හතරවන මහ සභා රැස්වීමේ කෙටුම්පත් වාර්තාව**

**දිනය :-2021.12.21**

**ස්ථානය :- නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය සභාව**

**වේලාව :- පෙ.ව 10.00**

**සහභාගී වූ :-**

| | | | |
|---|---|---|---|
| **01.** | ගරු සභාපති | එස්.බී කුමාරදාස මැතිතුමා | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| **02.** | ගරු උප සභාපති | එම් සරත් ප්‍රේමචන්ද්‍ර මැතිතුමා | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| **03.** | ගරු මන්ත්‍රී | බී.ඒ.ජී.එම්.කේ.ජී.ජී කුමාරි මැතිනිය | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| **04.** | ගරු මන්ත්‍රී | කේ.ඒ ශාන්ත මැතිතුමා | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| **05.** | ගරු මන්ත්‍රී | කේ.ඒ සංජීව මැතිතුමා | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| **06.** | ගරු මන්ත්‍රී | ජේ.ඒ.ඩී විමලසිරි මැතිතුමා | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| **07.** | ගරු මන්ත්‍රී | ජේ.ඒ ජයවර්ධන මැතිතුමා | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| **08.** | ගරු මන්ත්‍රී | පී.එස්.බී සිරිවර්ධන මැතිතුමා | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| **09.** | ගරු මන්ත්‍රී | එච්.ඩබ්.ජී.එන් කුමුදු වසන්ති මැතිනිය | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| **10.** | ගරු මන්ත්‍රී | ආර්.එම් කුමාරසිංහ මැතිතුමා | ( එ.ජා.ප) |
| **11.** | ගරු මන්ත්‍රී | ඩී.පී බන්දුලසේන මැතිතුමා | ( ශ්‍රී.ල නි.ප) |
| **12.** | ගරු මන්ත්‍රී | එම්.ඒ විමලසුරේන්ද්‍ර මැතිතුමා | ( එ.ජා.ප) |
| **13.** | ගරු මන්ත්‍රී | ආර්.එම්.අයි ජනක ශ්‍රීමාලි මැතිනිය | ( එ.ජා.ප) |
| **14.** | ගරු මන්ත්‍රී | ඩී.එම්.එන් සුභාෂිණී බංඩාර මැතිනිය | ( එ.ජා.ප) |
| **15.** | ගරු මන්ත්‍රී | ජී.ඒ නෙළුම් මැතිනිය | ( එ.ජා.ප) |
| **16.** | ගරු මන්ත්‍රී | පී කරුණාරත්න මැතිතුමා | ( ශ්‍රී.ල නි.ප) |
| **17.** | ගරු මන්ත්‍රී | කේ. හැරිසෙන්ස් මැතිතුමා | ( ජ.වි.පෙ) |
| **18.** | ගරු මන්ත්‍රී | වයි.එම් ගාමිණී බංඩාර මැතිතුමා | (ස්වාධීන කණ්ඩායම) |

**දන්වා සහභාගී නොවූ:-**

| | | | |
|---|---|---|---|
| **19.** | ගරු මන්ත්‍රී | බී.බී.ඊ ගයාන් චාමර මැතිතුමා | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| **20.** | ගරු මන්ත්‍රී | පී.ටී සිරිසේන මැතිතුමා | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| **21.** | ගරු මන්ත්‍රී | එස්.ඒ.කේ.පී ගුණවර්ධන මැතිතුමා | ( ජ.වි.පෙ) |

**නිළධාරීන්:-**

**01.** **ලේකම් බී.එච් ප්‍රදීප් නිශාන්ත මයා**

**02.** **විෂය භාර කළමණාකරන සේවා නිළධාරී අයි.ජී.සී.නයෝමි වීරකෝන් මිය**

<u>ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා</u> ගරු උප සභාපතිතුමා ඇතුළු ගරු මන්ත්‍රීතුමන්ලා හා ගරු මන්ත්‍රීතුමියන්ලා වෙත සුභ උදෑසනක් ප්‍රාර්ථනය කරමින්, ඉතාම ආදරයෙන් ගෞරවයෙන් පිළිගනිමින් න්‍යායපත්‍රානුකූලව සභාවේ වැඩ කටයුතු ආරම්භ කරන ලද අතර LDSP ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී උතුරු මැද පළාත තුලින්ම අනුරාධපුර දිස්ත්‍රික්කය තුල අපගේ ප්‍රාදේශීය සභාව පරීක්ෂා කිරීම සඳහා යොදා ගෙන ඇති බැවින් අද දින සභාවේ ලේකම්වරයා එම පරීක්ෂණ මණ්ඩලය සමඟ රැදී සිටින බැවින් අද දින සභාවට නොපැමිණෙන බව සඳහන් කරන ලදී.

එම අවස්ථාවේදී නැගී සිටි ගරු මන්ත්‍රී ඩී.පී බන්දුලසේන මැතිතුමා අදාල කාර්යය අත්‍යාවශ්‍ය බැවින් හා ඒ සඳහා ගරු සභාපතිතුමාද සහභාගී විය යුතු බැවින් මහ සභාව පෙ.ව 11.30 දක්වා කල් තැබීම සුදුසු බවට යෝජනා කරන ලදී.

ගරු මන්ත්‍රී කේ.ඒ ශාන්ත මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදී.ඒ අනුව 2021.12.21 වන දින මහ සභාව පෙ.ව 11.30 දක්වා කල් තැබිණි.

අනතුරුව පෙ.ව 11.30 ට මහ සභාව නැවත ආරම්භ කල අතර මහ සභාව අඛණ්ඩව ඉදිරියට කරගෙන යාම සුදුසු බවට ගරු උප සභාපතිතුමා විසින් යෝජනා කල අතර ගරු මන්ත්‍රී කේ.ඒ ශාන්ත මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා බල ප්‍රදේශයේ ජනතාවට යහපතක් උදා කිරීම අරමුණු කරගෙන පැමිණි දූත පිරිස වෙනුවෙන් තමන්ගේ සහභාගීත්වය ලබා දීමට අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ස්තූතිය ප්‍රකාශ කරමින් සභාවේ වැඩ කටයුතු ආරම්භ කරන ලදී.

**අ) මහ සභා වාර්ථාව සභා සම්මත කර ගැනීම.**

**2021.11.23 මහ සභා කෙටුම්පත් වාර්ථාව**

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා 2021.11.23 වන දින පැවැත් වූ මහ සභා රැස්වීමේ කෙටුම්පත් වාර්තාව ප්‍රාදේශීය සභා රීතීන්ට අනුව ඔබ වෙත ලැබීමට සළස්වා ඇති බැවින් එම වාර්ථාවේ අඩුපාඩු ඇත්නම් සංශෝධනයන්ට යටත්ව සභා සම්මත කර ගන්නා ලෙස ප්‍රකාශ කරමින් 2021.11.23 මහ සභා කෙටුම්පත් රැස්වීම් වාර්ථාව සංශෝධනයන්ට යටත්ව සභා සම්මත කිරීම සුදුසු බවට යෝජනා කරන ලදී.

ගරු මන්ත්‍රී ජේ.ඒ.ඩී විමලසිරි මැතිතුමා 2021.11.23 දින පැවති මහ සභාවේ කෙටුම්පත් වාර්ථාව සංශෝධනයන්ට යටත්ව සභා සම්මත කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමා කල යෝජනාව ස්ථිර කරන ලදී.

ගරු මන්ත්‍රී ආර්.එම් කුමාරසිංහ මැතිතුමා තමා සභාවෙන් පිටත්වීමට පෙර සභාවේ නීත්‍යානුකූලභාවය සම්බන්ධයෙන් ගැටළුව ඉදිරිපත් කර සභාව කල් තබන ලෙස ඉල්ලා සිටියත් සභාව අඛණ්ඩව පවත්වාගෙන යාම සුදුස බවට යෝජනා ස්ථිර කර ගත් නමුත් වෙන් වෙන් වශයෙන් ඡන්ද විමසීමක් සිදු නොකල බැවින් එලෙස ඡන්ද විමසීමක් සිදු කල ආකාරයට වාර්ථාව තුල සටහන් කිරීම වැරදි බව සඳහන් කරන ලදී.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා අදාල සංශෝධනය පිළිගත නොහැකි බව සඳහන් කරන ලදී.

ඒ අනුව 2021.11.23 වන දින මහ සභා කෙටුම්පත් වාර්ථාව සංශෝධන රහිතව සභා සම්මත විය.

**ආ) සභාපතිතුමන් විසින් කරනු ලබන විශේෂ නිවේදනය.**

**01. ඉදිකිරීම් කටයුතු වලට අදාලව අදාලව මිල ගැලපුම් ලබා දීම.**

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා උතුරු මැද පළාත් සභාව විසින් ක්‍රියාත්මක කරනු ලබන ඉදිකිරීම් ව්‍යාපෘතිවලට අදාලව කොන්ත්‍රාත්තු පැවරී ඇති බොහෝ ඉදි කිරීම් කොන්ත්‍රාත් ආයතන සහ ප්‍රජා පාදක සංවිධාන විසින් ඉදිකිරීම් කටයුතු සඳහා භාවිතා කරනු ලබන යෙදවුම් වල මිල වැඩි වී ඇති හෙයින් දැනටමත් ගිවිසගෙන ඇති මිල ගණන් මත ඉදි කිරීම් කටයුතු කර ගෙන යාම අපහසු බැවින් ඒ වෙනුවෙන් මිල වැඩිවීම් ලබා දෙන ලෙස ඉල්ලා තිබීම තුල අදාල ඉල්ලීම් සලකා බලා දැනටමත් පවරා ඇති ඉදි කිරීම් කොන්ත්‍රාත්තු සඳහා එම වැඩ කොන්ත්‍රාත්තුවලට යොදා ගන්නා යෙදවුම් වල මිල වෙළඳපල තුල වැඩි වීමට අනුව මිල වැඩි වීම සඳහා ගෙවීම් කල යුතු ආකාරය පිළිබඳ නිර්දේශ ලබා ගැනීමට කමිටුවක් පත් කරන ලද අතර එම කමිටුවේ නිර්දේශය සැලකිල්ලට ගෙන දැනටමත් පවරා ඉදි කර ගෙන යන ඉදිකිරීම් කොන්ත්‍රාත්තු සඳහා මිල

වැඩි වීම ඉල්ලා සිටින්නේ නම් පමණක් ඒ සඳහා ගෙවීම් කිරීමට ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමැතිය ලබා දී ඇති බවට සඳහන් කර ප්‍රධාන ලේකම් කාර්යාලය විසින් යොමු කර ඇති ලිපිය මහ සභාවට නිවේදනය කරන ලදී.

**ඇ) ප්‍රාදේශීය සභාව වෙත අමතා එවන ලද සංදේශ පෙත්සම්, පැමිණිලි සහ සන්නිවේදන**

**01. නොදන්වා මාර්ගය සංවර්ධනය කිරීම.**

<u>ගරු මන්ත්‍රී බී.ඒ.ජී.එම්.කේ.ජී.ජී කුමාරිහාමි මැතිණිය</u> විසින්, නොදන්වා මාර්ගය සංවර්ධනය කිරීම සම්බන්ධයෙන් ලිපියක් තමා සතුව පවතින බව සඳහන් කරමින් අදාල ලිපිය ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන ලෙස ප්‍රකාශ කරන ලදී.

ගරු උප සභාපති එම් සරත් ප්‍රේමදන්ද්‍ර මැතිතුමා අදාල සංදේශය සභාවට කියවා ඉදිරිපත් කිරීම සඳහා එතුමියට අවස්ථාව ලබා දීම සුදුස බවට යෝජනා කල අතර ගරු මන්ත්‍රී කේ.ඒ ශාන්ත මැතිතුමා විසින් ස්ථිර කරන ලදී. ඒ අනුව ගරු මන්ත්‍රී බී.ඒ.ජී.එම්.කේ.ජී.ජී කුමාරිහාමි මැතිණිය විසින් අදාල සංදේශය මහ සභාවට ඉදිරිපත් කරන ලදී.

<u>ගරු මන්ත්‍රී බී.ඒ.ජී.එම්.කේ.ජී.ජීකුමාරිහාමි මැතිණිය</u> විජයපුර කොට්ඨාශ අංක 04 හි 247 තුලානයේ මාර්ටින් වික්‍රමසිංහ මාවත යම් ආයතනයක් මගින් හෝ පුද්ගලයෙකු විසින් සංවර්ධන කරනු ලබන නමුත් මෙහි වැඩ ඇස්තමේන්තුවක් හෝ කරන වැඩ ප්‍රමාණයක් පිළිබඳව පූර්ව දැනුම් දීමක් හෝ සභාව දැනුවත් වී නොමැති බවත්, මේ වන විට තාර අතුරා ප්‍රතිසංස්කරණය කර අවසන් කර ඇතත්, එම මාර්ගය නුවර වැව මාවතට යා වන ස්ථානයේ අඩි 07 ක් පමණ විශාල බෝක්කුව කඩා දමා ගොස් ඇති බැවින් එහි ජලය ගලා යාමේ ගැටළුව පැන නැගී ඇති බවත්, මෙම බෝක්කුව ප්‍රාදේශීය සභාවට අයත් බවත්, මීට පෙර අදාල මාර්ගයේ කාණුවක අවශ්‍යතාවය ක් නොතිබූ බවත්, මේ වන විට සිදු කර ඇති ක්‍රියාදාමයන් තුල අදාල ප්‍රදේශය කුඩා වැස්සකට පවා ජලයෙන් යට වන තත්වයකට පත් වී ඇති බැවින් අදාල මාර්ගයේ පදිංචි නිවාස 25 හි ජනතාව සිය නිවාස වලට පිවිසීමට අවශ්‍ය බෝක්කු ඉල්ලුම් කරන බවත්, සඳහන් කරන ලදී.

තවද මෙම මාර්ගය ඉදි කිරීම සිදු කළේ කවුරුන්ද යන්නත්, මෙය ප්‍රාදේශීය සභාවේ ගරු සභාපතිවරයා, ලේකම්වරයා හෝ තාක්ෂණ නිළධාරීයාගේ දැනුවත් භාවයකින් තොරව සිදු කිරීම සම්බන්ධව විශාල ගැටළුවක් පවතින බව ද සඳහන් කරන ලදී.

තවද ප්‍රාදේශීය සභාවට අයත් කම්කරු මාවත ද මේ වන විට කුට්ටි ගල් අතුරා සංවර්ධනය කරන මුත් මෙහිද බෝක්කු කඩා දමා ඇති බවත්, කොන්ත්‍රාත්කරු විසින් අදාල වගකීම භාර ගෙන නොමැති බවත්, අදාල මාර්ගයේ නිවස් හිමියන්ද බෝක්කු ලබා දෙන ලෙසට ඉල්ලුම් කරන බවත්, සඳහන් කරමින් මෙලෙස ව්‍යාපෘති කිසිදු දැනුවත් කිරීමකින් තොරව සිදු කිරීම සම්බන්ධව මීට වඩා අවධානය යොමු කරන ලෙසත්, බල ප්‍රදේශයේ කොන්ත්‍රාත් සිදු කිරීමේදී බල ප්‍රදේශයේ ලියාපදිංචි ස්වෙච්ඡා සංවිධාන හරහා පමණක් ගිවිසුම් ගත වීමට අවධානය යොමු කරන ලෙස ප්‍රකාශ කරන ලදී.

<u>ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා</u> ඉදිරිපත් කල කරුණු සම්බන්ධයෙන් ඉදිරියේදී තාක්ෂණ නිළධාරිතුමා යොමු කර වාර්ථාවක් ලබා ගන්නා අතර අදාල ආයතන වෙත කරුණු දැනුම් දෙන බවත්, මෙම මාර්ගයේ කාණු පද්ධතිය සකස් කිරීම වෙනුවෙන් අවශ්‍ය හියුම් පයිප්ප මිල දී ගන්නා ලෙසට ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය හා කොමසාරිස්තුමාගේ නිර්දේශය හිමි වී ඇති හෙයින් ජනතාව වන අපහසුතාවය වෙනුවෙන් බෝක්කු මිල දී ගැනීමට කටයුතු කලත්, පවතින ගැටළුකාරි තත්වය හමුවේ අදාල හියුම් පයිප්ප ලබා නොදීමට පියවර ගන්නා බව සඳහන් කරන ලදී.

**02. තාප්පයට සම්බන්ධව කපන ලද කාණුව වසා දැමීම.**

<u>ගරු මන්ත්‍රී කේ හැරිසෙන්ස් මැතිතුමා</u> විසින් බල ප්‍රදේශයේ අනවසර ඉදි කිරීමක් සම්බන්ධයෙන් වන සංදේශයක් ඉදිරිපත් කිරීමට පවතින බව සඳහන් කරමින් ඒ සඳහා අවස්ථාව ලබා දෙන ලෙස ප්‍රකාශ කරන ලදී.

ගරු මන්ත්‍රී ඩී.පී බන්දුලසේන මැතිතුමා හා ගරු මන්ත්‍රී පී කරුණාරත්න මැතිතුමාගේ යෝජනා ස්ථිරත්වයෙන් එම සංදේශය ඉදිරිපත් කිරීම සඳහා අවස්ථාව ලබා දෙන ලදී.

ඒ අනුව ගරු මන්ත්‍රී කේ.හැරිසෙන්ස් මැතිතුමා 341, අනුලාදේවී මාවත, විජයපුර ලිපිනයේ පදිංචි ප්‍රදීපා මාලිකා යන අය විසින් සිය තාප්පයට සම්බන්ධව කපන ලද මාර්ගයේ කාණුව වසා දමන ලෙසට කර ඇති ඉල්ලීම ඇතුලත්, ලිපිය මහ සභාවට කියවා ඉදිරිපත් කරන ලදී.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා අදාල ස්ථානය පරීක්ෂා කිරීම සඳහා තමන් ගිය බවත්, එම මාර්ගය වර්ෂාවත් සමඟ ජලයෙන් යටවීමේ අවධානමක් පවතින බවත්, මේ සඳහා එම ඉදි කර ඇති තාප්පය හේතු වී ඇති බවත්, එම මාර්ගයේ කාණුව කැපීම මේ වන විට සිදු කර ඇති බවත් සඳහන් කරන ලද අතර ඉදිරියේදී එම ගැටළුව මතු නොවන බවද ප්‍රකාශ කරන ලදී.

**ආ) යථා පරිදි කල් දී ඇති ප්‍රශ්ණ**

නැත.

**ඉ) යථා පරිදී කල් දී ඇති යෝජනා**

**01. විශේෂ සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.**

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා ප්‍රමුඛ සංවර්ධන අවශ්‍යතා සහිත විශේෂ සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම 2021 යටතේ මෙම ප්‍රාදේශීය සභාව වෙත හිමි වී ඇති ව්‍යාපෘති මහ සභාවට ඉදිරිපත් කරමින් එම ව්‍යාපෘති වලට අදාල ප්‍රසම්පාදන කාර්යය සිදු කිරීමට හා අදාල ව්‍යපෘති ප්‍රාදේශිය සභාව හරහා ක්‍රියාත්මක කිරීම සුදුසු බවට යෝජනා කරන ලදී.

| අනු අංකය | ව්‍යාපෘති අංකය | වලංගු ව්‍යාපෘතිය | 2021 වර්ෂය සඳහා අනුමත මුදල |
|---|---|---|---|
| 01 | 21/600/03/01/2202/23 (ii)n/a/551 | අබේපුර රන්මිණි උයන අතුරු මාර්ගය සංවර්ධනය කිරීම | 700,000.00 |
| 02 | 21/600/03/01/2202/23 (ii)n/a/81 | වන්නියම්කුලම ශ්‍රී රාහුල සුභසාධක සමිතිශාලාව ඉදිකිරීම | 200,000.00 |
| 03 | 21/600/03/01/2202/23 (ii)n/a/82 | කුඩා නෙළුම්කුලම ලක්මුතු ග්‍රාම සංවර්ධන සමිති ශාලාවේ වහලය සකස් කිරීම හා ඉතිරි වැඩ නිම කිරීම | 200,000.00 |
| 04 | 21/600/03/01/2202/23 (ii)n/a/91 | සෙවිලි තහඩු ලබා දීම - පී ජයසිංහ මයා, හල්මිල්ලවැව, කුරුන්දන්කුලම | 50,000.00 |
| 05 | 21/600/03/01/2202/23 (ii)n/a/92 | සෙවිලි තහඩු ලබා දීම - කේ.ඩී.ජී.එස් රාජපෙක්ෂ මයා , ඉහල කවරක්කුලම, ගල් කුලම. | 50,000.00 |
| 06 | 21/600/03/01/2202/23 (ii)n/a/246 | පුටු ලබා දීම - ශ්‍රී ධර්මාලංකාර විහාරස්ථාන දහම් පාසල | 25,000.00 |
| 07 | 21/600/03/01/2202/23 (ii)n/a/258 | පුටු ලබා දීම - නාච්චාදූව නෙළුබැව ශ්‍රී සුමන සුභ සාධක සමිතිය | 25,000.00 |
| 08 | 21/600/03/01/2202/23 (ii)n/a/302 | පොතානේගම ශ්‍රී විජය ළඳරු පෙර පාසල සඳහා සෙල්ලම් උපකරණ ලබා දීම. | 30,000.00 |

| | | | |
|---|---|---|---|
| 09 | 21/600/03/01/2202/23 (ii)n/a/35 | බෝක්කුවක් ඉදි කර බොරළු දැමීම -241 තුලාන, සඳගම ,3 වන පටුමඟ උපසේන මහතාගේ නිවස අසළ සිට | 300,000.00 |
| 10 | 21/600/03/01/2202/23 (ii)n/a/36 | අතුරු පාර මැද ඇති විදුලි කණුව ඉවත් කිරීම - 241 තුලාන අලුත් නුවර පාර වෛද්‍ය බලකාය අසල අතුරු මාර්ගය | 30,000.00 |
| 11 | 21/600/03/01/2202/2/24 (i)n/a/429 | කළුවිල, හිදෝගම ගාමිණි කුසුමුසිරි මයා සඳහා වැසිකිළි පහසුකම් ලබා ගැනීම සඳහා සහය ලබා දීම. | 40,000.00 |
| 12 | 21/600/03/01/2202/2/24 (i)n/a/430 | අංක 93,7 ඇල, හිදෝගම එච්.ජී ප්‍රේමාවතී මිය සඳහා වැසිකිළි පහසුකම් ලබා දීම | 40,000.00 |
| 13 | 21/600/03/01/2202/2/24 (i)n/a/431 | අංක 632, අළුත්වැව, ශ්‍රාවස්තිපුර ආර්.එම්.එස්.බී මඩුගල්ල මයා,සඳහා වැසිකිළි පහසුකම් ලබා දිම | 40,000.00 |
| 14 | 21/600/03/01/2202/2/24 (i)n/a/432 | හිදෝගම, මහ නෙළුබැව, එච්.එම් රංබණ්ඩා මයා සඳහා වැසිකිළි පහසුකම් ලබා දීම. | 40,000.00 |
| 15 | 21/600/03/01/2202/2/24 (i)n/a/433 | වදාකඩ, ශ්‍රාවස්තිපුර සුනිල් ශාන්ත වීරසිංහ මයා සඳහා වැසිකිළි පහසුකම් ලබා දීම | 40,000.00 |
| 16 | 21/600/03/01/2202/2/24 (i)n/a/394 | කිඹුලාකඩ, ශ්‍රාවස්තිපුර කේ.එස්.එම් නිරෝෂා මිය - සෙවිලි තහඩු හා වැසිකිළි ආධාර ලබා දීම | 60,000.00 |
| 17 | 21/600/03/01/2202/2/24 (i)n/a/395 | කිඹුලාකඩ, ශ්‍රාවස්තිපුර එම්.ඒ අනුෂා ගයානි මාරසිංහ මිය - සෙවිලි තහඩු හා වැසිකිළි ආධාර ලබා දීම | 60,000.00 |
| 18 | 21/600/03/01/2202/2/24 (i)n/a/396 | සුචරිතගම, අනුරාධපුර අයි.පී.ඩී දිල්රුක් අසංක ගුණතුංග මයා - සෙවිලි තහඩු හා වැසිකිළි ආධාර ලබා දීම | 60,000.00 |
| 19 | 21/600/03/01/2202/2/24 (i)n/a/397 | යහලේගම, අනුරාධපුර ජේ.ඒ පුෂ්ප කුමාර ජයසිංහ මයා - සෙවිලි තහඩු හා වැසිකිළි ආධාර ලබා දීම | 60,000.00 |
| 20 | 21/600/03/01/2202/2/24 (i)n/a/398 | මහපාලාඩිකුළම, අනුරාධපුර පී.පී ජයසිංහ මයා - සෙවිලි තහඩු හා වැසිකිළි ආධාර ලබා දීම | 60,000.00 |

<u>ගරු මන්ත්‍රී ජේ.ඒ.ඩී විමලසිරි මැතිතුමා</u> අදාල ව්‍යාපෘති වලට අවශ්‍ය ප්‍රසම්පාදන ක්‍රියාවලිය සිදු කර ප්‍රාදේශීය සභාව හරහා ක්‍රියාත්මක කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් ගෙන ආ යෝජනාව ස්ථිර කරන ලදී.

<u>ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා</u> ඉදිරිපත් කල යෝජනාව සම්බන්ධයෙන් යම් විරෝධතාවයක් පවතින්නේ ද යන්න විමසන ලද අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූ බැවින් අදාල ව්‍යාපෘති ප්‍රාදේශීය සභාව හරහා ක්‍රියාත්මක කිරීම සුදුසු බවට වූ යෝජනාව පැමිණ සිටි ගරු මහජන නියෝජිතයන්ගේ ඒකඟතාවය මත සභා සම්මත විය.

**02.** **මුදල් කමිටු නිර්දේශ ක්‍රියාත්මක කිරීම.**

<u>ගරු සභාපති එස්.බී. කුමාරදාස මැතිතුමා</u> 2021.12.09 වන දින පැවති මුදල් කමිටුව මගින් ලබා ගත් පහත සඳහන් නිර්දේශ සඳහා මහ සභා අනුමැතිය ලබා දීම සුදුසු බවට යෝජනා කරන ලදී.

**I. ප්‍රාදේශීය සභාවට අයත් LL 7004 දරණ ටිපර් රථය සඳහා අවශ්‍ය බැටරිය මිල දී ගැනීම.**

ප්‍රාදේශීය සභාවට අයත් LL 7004 දරණ ටිපර් රථය සඳහා අවශ්‍ය බැටරිය මිල දී ගැනීම වෙනුවෙන් කැඳවන ලද මිල ගණන් මුදල් කමිටුවට ඉදිරිපත් කරන ලද අතර කැඳවන ලද මිල ගණන් අතරින් අවම මිල ගණන් ඉදිරිපත් කර ඇති අංක 16,17, නුවර වැව පාර, අනුරාධපුර ලිපිනයේ පිහිටි ඉන්දික ටයර් සෙන්ටර් වෙතින් අවශ්‍ය බැටරි සම්පූර්ණ වටිනාකම රු 55,500 මිල දී ගැනීම සුදුසු බවට මුදල් කමිටුවේ නිර්දේශය ලබා දෙන ලදී.

**II. ප්‍රාදේශීය සභාවට අයත් කවරක්කුලම ආර්ථික මධ්‍යස්ථානයේ වැහි පීලි සවි කිරීම වෙනුවෙන් අවශ්‍ය ද්‍රව්‍ය මිල දී ගැනීම**

ප්‍රාදේශීය සභාවට අයත් කවරක්කුලම ආර්ථික මධ්‍යස්ථානයේ වැහි පීලි සවි කිරීම වෙනුවෙන් අවශ්‍ය ද්‍රව්‍ය මිල දී ගැනීම සඳහා කැඳවන ලද මිල ගණන් මුදල් කමිටුවට ඉදිරිපත් කරන ලද අතර කැඳවන ලද මිල ගණන් අතරින් අවම මිල ගණන් ඉදිරිපත් කර ඇති අංක 90, මහ විදිය, අනුරාධපුර ලිපිනයේ පිහිටි මහජන හාඩ්වෙයාර් වෙතින් වැහිපීලි සවි කිරීම වෙනුවෙන් අවශ්‍ය ද්‍රව්‍ය මිල දී ගැනීම සුදුසු බවට මුදල් කමිටුවේ නිර්දේශය ලබා දෙන ලදී.

**01.** **ප්‍රාදේශීය සභාවට අයත් ZA 5033 දරණ බැකෝ ලෝඩරය අළුත්වැඩියා කිරීම.**

ප්‍රාදේශීය සභාවට අයත් ZA 5033 දරණ බැකෝ ලෝඩරය අළුත්වැඩියා කිරීම සඳහා අවශ්‍ය ද්‍රව්‍ය මිල දී වෙනුවෙන් කැඳවන ලද මිල ගණන් මුදල් කමිටුවට ඉදිරිපත් කරන ලද අතර කැඳවන ලද මිල ගණන් අතරින් අවම මිල ගණන් ඉදිරිපත් කර ඇති අංක 49, බැංකු පෙදෙස, අනුරාධපුර ලපිනයේ පිහිටි එෆ් ඇන්ඩ් එෆ් මැෂිනරි වෙතින් බැකෝ ලෝඩරය අළුත්වැඩියා කිරීම සඳහා අවශ්‍ය ද්‍රව්‍ය හා උපකරණ මිල දී ගැනීම සඳහා මුදල් කමිටුවේ නිර්දේශය ලබා දෙන ලදී.

**III. ප්‍රාදේශීය සභාවේ මුරකරුවන් වෙනුවෙන් අවශ්‍ය විදුලි පන්දම් මිල දී ගැනීම.**

ප්‍රාදේශීය සභාවේ මුරකරුවන් වෙනුවෙන් අවශ්‍ය විදුලි පන්දම් මිල දී ගැනීම වෙනුවෙන් කැඳවන ලද මිල ගණන් මුදල් කමිටුවට ඉදිරිපත් කරන ලද අතර කැඳවන ලද මිල ගණන් අතරින් අවම මල ගණන් ඉදිරිපත් කර ඇති අංක 122, බැංකු පෙදෙස, අනුරාධපුර ලිපිනයේ පිහිටි ශශී ඉලෙක්ට්‍රිකල්ස් වෙතින් අවශ්‍ය විදුලි පන්දම් මිල දී ගැනීම සුදුසු බවට මුදල් කමිටුවේ නිර්දේශය ලබා දෙන ලදී.

**IV. බ්ගොල් ගල් නිෂ්පාදන මධ්‍යස්ථානය වටා වැට ඉදි කිරීම වෙනුවෙන් අවශ්‍ය ද්‍රව්‍ය මිල දී ගැනීම.**

ප්‍රාදේශීය සභාවට අයත්, බ්ලොග් ගල් නිෂ්පාදන මධ්‍යස්ථානය වටා වැට ඉදි කිරීම වෙනුවෙන් අවශ්‍ය ද්‍රව්‍ය මිල දී ගැනීම සඳහා කැඳවන ලද මිල ගණන් මුදල් කමිටුවට ඉදිරිපත් කරන ලද අතර කැඳවන ලද මිල ගණන් අතරින් අවම මිල ගණන් ඉදිරිපත් කර ඇති අංක 90, මහ විදිය, අනුරාධපුර ලිපිනයේ පිහිටි මහජන හාඩ්වෙයාර් වෙතින් කම්බි කට්ට ගැසීම සඳහා අවශ්‍ය ද්‍රව්‍ය මිල දී ගැනීමට මුදල් කමිටුවේ නිර්දේශය ලබා දෙන ලදී.

**V. ප්‍රාදේශීය සභා කාර්යාලයේ විදුලි සම්බන්ධතා පරිපථය යාවත්කාලීන කිරීම.**

ප්‍රාදේශීය සභා කාර්යාලයේ විදුලි සම්බන්ධතා පරිපථය යාවත්කාලීන කිරීම සඳහා අවශ්‍ය ද්‍රව්‍ය මිල දී වෙනුවෙන් කැඳවන ලද මිල ගණන් මුදල් කමිටුවට ඉදිරිපත් කරන ලද අතර ඉදිරිපත් කරන ලද මිල ගණන් අතරින් අවම මිල ගණන් ඉදිරිපත් කර ඇති අංක 122, බැංකු පෙදෙස, අනුරාධපුර ලිපිනයේ පිහිටි ශශී ඉලෙක්ට්‍රිකල්ස් වෙතින් අවශ්‍ය විදුලි සම්බන්ධතා ලබා ගැනීමේ උපකරණ හා ද්‍රව්‍ය මිල දී ගැනීම සුදුසු බවට මුදල් කමිටුවේ නිර්දේශය ලබා දෙන ලදී.

**VI. පළාත් පාලන දෙපාර්තමේන්තුව මගින් ප්‍රමුඛ සංවර්ධන අවශ්‍යතා සහිත විශේෂ සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම - 2021 -සමාජ සුභ සාධන කටයුතු යටතේ බල ප්‍රදේශයේ ස්වේච්ඡා සංවිධාන දෙකකට හා එක් දහම් පාසලක් සඳහා අවශ්‍ය ප්ලාස්ටික් පුටු මිල දී ගැනීම**

පළාත් පාලන දෙපාර්තමේන්තුව මගින් ප්‍රමුඛ සංවර්ධන අවශ්‍යතා සහිත විශේෂ සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම - 2021 -සමාජ සුභ සාධන කටයුතු යටතේ බල ප්‍රදේශයේ ස්වේච්ඡා සංවිධාන දෙකකට හා එක් දහම් පාසලක් සඳහා අවශ්‍ය ප්ලාස්ටික් පුටු මිල දී ගැනීම වෙනුවෙන් කැඳවන ලද මිල ගණන් මුදල් කමිටුවට ඉදිරිපත් කරන ලද අතර කැඳවන ලද මිල ගණන් අතරින් අවම මිල ගණන් ඉදිරිපත් කර ඇති යාපනය හංදිය, මාන්කඩවල ලිපිනයේ පිහිටි එම්.සී ඩිස්ට්‍රිබියුටර්ස් වෙතින් අවශ්‍ය ප්ලාස්ටික් පුටු මිල දී ගැනීම සඳහා මුදල් කමිටුවේ නිර්දේශය ලබා දෙන ලදී.

**VII. කොට්ඨාශ මට්ටමින් මහජනතාව විසින් ගරු මන්ත්‍රීවරුන් හරහා කරන ලද සුභසාධක ඉල්ලීම් ඉටු කිරීම**

කොට්ඨාශ මට්ටමින් මහජනතාව විසින් ගරු මන්ත්‍රීවරුන් හරහා කරන ලද සුභසාධක ඉල්ලීම් සඳහා අවශ්‍ය ශබ්ධ විකාශන යන්ත්‍ර මිල දී ගැනීම වෙනුවෙන් කැඳවන ලද මිල ගණන් මුදල් කමිටුවට ඉදිරිපත් කරන ලද අතර කැඳවන ලද මිල ගණන් අතරින් ශබ්ධ විකාශන යන්ත්‍ර සඳහා අවම මිල ගණන් ඉදිරිපත් කර ඇති අංක 07, මාර්කට් පෙදෙස, අනුරාධපුර ලිපිනයේ පිහිටි නිව් ලංකා රේඩියෝ වෙතින් මිල දී ගැනීම සුදුසු බවට මුදල් කමිටුවේ නිර්දේශය ලබා දෙන ලදී.

**VIII. ප්‍රාදේශීය සභා කාර්යාලයට අවශ්‍ය ඉබි යතුරු මිල දී ගැනීම**

ප්‍රාදේශීය සභා කාර්යාලයට අවශ්‍ය ඉබි යතුරු මිල දී වෙනුවෙන් කැඳවන ලද මිල ගණන් මුදල් කමිටුවට ඉදිරිපත් කරන ලද අතර කැඳවන ලද මිල ගණන් අතරින් අවම මිල ගණන් ඉදිරිපත් කර ඇති අංක 90, මහ විදිය, අනුරාධපුර ලිපිනයේ පිහිටි මහජන හාඩ්වෙයාර් වෙතින් අවශ්‍ය ඉබි යතුරු මිල දී ගැනීම සඳහා මුදල් කමිටුවේ නිර්දේශය ලබා දෙන ලදී.

**IX. පළාත් පාලන දෙපාර්තමේන්තුව මගින් ප්‍රමුඛ සංවර්ධන අවශ්‍යතා සහිත විශේෂ සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම - 2021 -සමාජ සුභ සාධන කටයුතු යටතේ බල ප්‍රදේශයේ අඩු ආදායම් ලාභී පවුල් සඳහා අවශ්‍ය ඇස්බැස්ටෝ ශීට් මිල දී ගැනීම**

පළාත් පාලන දෙපාර්තමේන්තුව මගින් ප්‍රමුඛ සංවර්ධන අවශ්‍යතා සහිත විශේෂ සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම - 2021 -සමාජ සුභ සාධන කටයුතු යටතේ බල ප්‍රදේශයේ අඩු ආදායම් ලාභී පවුල් සඳහා අවශ්‍ය ඇස්බැස්ටෝ ශීට් මිල දී ගැනීම වෙනුවෙන් කැඳවන ලද මිල ගණන් මුදල් කමිටුවට ඉදිරිපත් කරන ලද අතර කැඳවන ලද මිල ගණන් අතරින් අවම මිල ගණන් ඉදිරිපත් කර ඇති දහයියාගම හංදිය, අනුරාධපුර ලිපිනයේ පිහිටි මිණිඳු හාඩ්වෙයාර් වෙතින් අවශ්‍ය ඇස්බැස්ටෝ ශීට් මිල දී ගැනීම සුදුසු බවට මුදල් කමිටුවේ නිර්දේශය ලබා දෙන ලදී.

**X. පළාත් පාලන දෙපාර්තමේන්තුව මගින් ප්‍රමුඛ සංවර්ධන අවශ්‍යතා සහිත විශේෂ සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම - 2021 -සමාජ සුභ සාධන කටයුතු යටතේ බල ප්‍රදේශයේ අඩු ආදායම් ලාභී පවුල් සඳහා සනීපාරක්ෂක වැසිකිළි පහසුකම් ලබා දීම.**

පළාත් පාලන දෙපාර්තමේන්තුව මගින් ප්‍රමුඛ සංවර්ධන අවශ්‍යතා සහිත විශේෂ සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම - 2021 -සමාජ සුභ සාධන කටයුතු යටතේ බල ප්‍රදේශයේ අඩු ආදායම් ලාභී පවුල් සඳහා සනීපාරක්ෂක වැසිකිළි පහසුකම් ලබා දීම වෙනුවෙන් අවශ්‍ය ද්‍රව්‍ය මිල දී ගැනීම සඳහා කැඳවන ලද මිල ගණන් මුදල් කමිටුවට ඉදිරිපත් කරන ලද අතර කැඳවන ලද මිල ගණන් අතරින් අවම මිල ගණන් ඉදිරිපත් කර ඇති අංක 90, මහ විදිය, අනුරාධපුර ලිපිනයේ පිහිටි මහජන හාඩ්වෙයාර් වෙතින් අවශ්‍ය වැසිකිළි පෝච්චි හා අහල් 04 පී.වී.සී බට මිල දී ගැනීමටත්, අංක 10, ශ්‍රාවස්තිවත්ත, ශ්‍රාවස්තිපුර ලිපිනයේ පිහිටි හිරු සප්ලයර්ස් වෙතින් අවශ්‍ය සිමෙන්ති මිල දී ගැනීමටත්, මුදල් කමිටුවේ නිර්දේශය ලබා දෙන ලදී.

**XI. පළාත් පාලන දෙපාර්තමේන්තුව මගින් ප්‍රමුඛ සංවර්ධන අවශ්‍යතා සහිත විශේෂ සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම - 2021 -සමාජ සුභ සාධන කටයුතු යටතේ බල ප්‍රදේශයේ අඩු ආදායම් ලාභී පවුල් සඳහා සනීපාරක්ෂක වැසිකිළි පහසුකම් ලබා දීම.**

පළාත් පාලන දෙපාර්තමේන්තුව මගින් ප්‍රමුඛ සංවර්ධන අවශ්‍යතා සහිත විශේෂ සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම - 2021 -සමාජ සුභ සාධන කටයුතු යටතේ බල ප්‍රදේශයේ අඩු ආදායම් ලාභී පවුල් සඳහා සනීපාරක්ෂක වැසිකිළි පහසුකම් ලබා දීම වෙනුවෙන් අවශ්‍ය ද්‍රව්‍ය මිල දී ගැනීම සඳහා කැඳවන ලද මිල ගණන් මුදල් කමිටුවට ඉදිරිපත් කරන ලද අතර කැඳවන ලද මිල ගණන් අතරින් අවම මිල ගණන් ඉදිරිපත් කර ඇති ජයන්ති මාවත, නව නගරය, අනුරාධපුර ලිපිනයේ පිහිටි සීමා සහිත නෝර්ත් සෙන්ට්‍රල් කොන්ක්‍රීට් වර්ක්ස් (පුද්) සමාගම වෙතින් අවශ්‍ය වැසිකිළි වළලු මිල දී ගැනීමට මුදල් කමිටුවේ නිර්දේශය ලබා දෙන ලදී.

**XII. බල ප්‍රදේශයේ මාර්ග සංවර්ධනය වෙනුවෙන් අවශ්‍ය බොරළු මිල දී ගැනීම**

බල ප්‍රදේශයේ මාර්ග සංවර්ධනය වෙනුවෙන් අවශ්‍ය බොරළු මිල දී ගැනීම වෙනුවෙන් කැඳවන ලද මිල ගණන් මුදල් කමිටුවට ඉදිරිපත් කරන ලද අතර කැඳවන ලද මිල ගණන් අතරින් බොරළු සැපයීම සඳහා අවම මිල ගණන් ඉදිරිපත් කර ඇති කුඩා වැව, ගල්කුලම ලිපිනයේ පදිංචි බී කුමාරසිංහ මහතාගෙන් මිල දී ගැනීමට මුදල් කමිටුවේ නිර්දේශය ලබා දෙන ලදී

**XIII. පළාත් පාලන දෙපාර්තමේන්තුව මගින් ප්‍රමුඛ සංවර්ධන අවශ්‍යතා සහිත විශේෂ සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම - 2021 -සමාජ සුභ සාධන කටයුතු යටතේ 258 පොතානේගම ශ්‍රී විජය පෙර පාසල සඳහා අවශ්‍ය සෙල්ලම් උපකරණ මිල දී ගැනීම.**

පළාත් පාලන දෙපාර්තමේන්තුව මගින් ප්‍රමුඛ සංවර්ධන අවශ්‍යතා සහිත විශේෂ සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම - 2021 -සමාජ සුභ සාධන කටයුතු යටතේ 258 පොතානේගම ශ්‍රී විජය පෙර පාසල සඳහා අවශ්‍ය සෙල්ලම් උපකරණ මිල දී ගැනීම වෙනුවෙන් කැඳවන ලද මිල ගණන් මුදල් කමිටුවට ඉදිරිපත් කරන ලද අතර කැඳවන ලද මිල ගණන් අතරින් අවම මිල ගණන් ඉදිරිපත් කර ඇති අංක 84,85,86, ප්‍රධාන වීදිය, අනුරාධපුර ලිපිනයේ පිහිටි සම් සම් සිටි ආයතනය වෙතින් අවශ්‍ය පෙර පාසල් සෙල්ලම් උපකරණ මිල දී ගැනීමට මුදල් කමිටුවේ නිර්දේශය ලබා දෙන ලදී.

**XIV. ඩෙංගු මර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම**

පවතින් වැසි සහිත කාලගුණ තත්වය හේතුවෙන් ඩෙංගු රෝගය පැතිර යාමේ අවධානමක් මේ වන විට උද්ගත වී ඇති බැවින් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ආවරණය වන පරිදී ඩෙංගු මර්ධන වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම සුදුසු බවට සංවර්ධන අංශයේ ඉල්ලීම් කර ඇති බැවින් ඒ සඳහා රු 50,000 ක වැයක් දැරීම සුදුසු බවට මුදල් කමිටුවේ නිර්දේශය ලබා දෙන ලදී.

**XV. කටුගම්පල උපාලි චාමර මහතාගේ නිවස ඉදිරිපිට මාර්ගයේ බොක්කුව ඉදි කිරීම.**

පළාත් පාලන දෙපාර්තමේන්තුව වෙත යොමු කර තිබූ මහජන පැමිණිල්ලකට අනුව නාච්චාදූව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ කටුගම්පල ප්‍රදේශයේ උපාලි චාමර මහතාගේ නිවස ඉදිරිපිට මාර්ගයේ බොක්කුව ඉදි කිරීමට අදාල රු 259,273.74 ක ඇස්තමේන්තුව මුදල් කමිටුවට ඉදිරිපත් කරන ලද අතර ඉදිරිපත් කරන ලද ඇස්තමේන්තුව ප්‍රකාරව එම බෝක්කුව ඉදි කිරීම සුදුසු බවට මුදල් කමිටුවේ නිර්දේශය ලබා දෙන ලදී.

<u>ගරු මන්ත්‍රී ජේ.ඒ .ඩී විමලසිරි මැතිතුමා</u> 2021.12.09 වන දින මුදල් කමිටුව මගින් ලබා ගත් නිර්දේශ සඳහා මහ සභා අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් ගෙන එන ලද යෝජනාව ස්ථිර කරන ලදී.

<u>ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා</u> මුදල් කමිටු නිර්දේශ ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් යම් විරෝධතාවයක් පවතින්නේ ද යන්න විමසූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූ බැවින් 2021. දෙසැම්බර් මස 09 වන දින පැවති මුදල් කමිටුවේ නිර්දේශ සඳහා මහ සභා අනුමැතිය ලබා දීමේ යෝජනාව පැමිණ සිටි සියළු මහජන නියෝජිතයන්ගේ එකඟතාවයෙන් සභා සම්මත විය.

**03. 2022 ජනවාරි මස සේවකයින්ගේ අතිකාල තක්සේරු වාර්ථා අනුමත කිරීම.**

<u>ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා</u> 2022 ජනවාරි මසට අදාලව කාර්යය මණ්ඩලය විසින් අතිකාල ඉල්ලීම් කර ඇති අතිකාල තක්සේරු වාර්ථා සභාවට ඉදිරිපත් කරමින් අදාල සේවකයින් වෙත අතිකාල තක්සේරු වාර්තා අනුමත කිරීම සුදුසු බවට යෝජනා කරන ලදී.

<u>**2022 ජනවාරි**</u>

| | | පැය ගණන |
|---|---|---|
| 01. එච්.එම්.එස්.ඩී චන්ද්‍රසිරි මිය | (කළ.සේවා නිළධාරී) | 60 |
| 02. එස්.එම් මහරගෙදර මිය | (සහකාර ගිණුම් නිළධාරී) | 60 |
| 03. අයි.ජී.සී.එන් වීරකෝන් මිය | (කළ.සේවා නිළධාරී) | 60 |
| 04. කේ.ජී.ඒ සම්මානි මිය | (කළ.සේවා නිළධාරී) | 60 |
| 05. කුමුදු වාසනා වීරසිංහ මිය | (කළ සහකාර (ආවරණ) | 60 |
| 06. ටී.එච්.ආර් තාරක මයා | (කළ සහකාර (ආවරණ) | 40 |
| 07. කේ.ජී.ජී.ඩී ගමගේ මිය | (පුස්තකාල සහායක) | 40 |
| 08. මානෙල් පුෂ්පකුමාරි මිය | (පුස්තකාල සහායක) | 40 |
| 09. ඒ.ඒ පියතිස්ස මයා | (මා.කම්කරු (මුරකරු ආවරණ) | 40 |
| 10. ටී.එච්.ඩී.ඩී පෙරේරා මයා | (මුරකරු(ආවරණ) | 40 |
| 11. එම් ආර්.පෙරේරා මයා | (මුරකරු) | 75 |
| 12. එස් අන්තෝනි මයා | (මාර්ග කම්කරු) | 40 |
| 13. සුභාෂ් ගයාෂාන් මයා | (අනියම් රියදුරු) | 40 |
| 14. බන්දුල දිසානායක | (මුරකරු ආවරණ) | 75 |
| 15. ජේ.එම්.ජේ.ආර්.කේ ජයසුන්දර මයා | (විදුලි කාර්මික) | 40 |

<u>ගරු මන්ත්‍රී කේ.ඒ සංජීව මැතිතුමා</u> 2022 ජනවාරි මසට අදාල අතිකාල ඉල්ලුම් කර ඇති සේවකයින්ගේ අතිකාල තක්සේරු වාර්ථා අනුමත කිරීම සුදුසු බවට ගරු සභාපති තුමා කල යෝජනාව ස්ථිර කරන ලදී.

<u>ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා</u> අතිකාල තක්සේරු වාර්තා අනුමත කිරීමේ යෝජනාව සම්බන්ධයෙන් යම් විරෝධතාවයක් පවතීද යන්න විමසූ අතර කිසිදු විරෝධතාවයක් ඉදිරිපත් නොවූ බැවින් 2022 ජනවාරි මස අතිකාල ඉල්ලුම්කල සේවකයින් වෙත අතිකාල තක්සේරු වාර්ථා අනුමත කිරීමේ යෝජනාව පැමිණ සිටි සියළු මහජන නියෝජිතයන්ගේ එකඟතාවයෙන් සභා සම්මත විය.

**04. 2022 වර්ෂයේ බලතල පැවරීම.**

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා 2022 වර්ෂයට අදාලව ගරු සභාපතිතුමා, ,ලේකම්තුමා හා සෞඛ්‍ය වෛද්‍ය නිළධාරී වෙත හා ආදායම් පරීක්ෂක, තාක්ෂණ නිළධාරී, තාක්ෂණ සහයක වෙත බලතල පැවරීමට අදාල යෝජනාව මහ සභාවට ඉදිරිපත් කරමින් එලෙස 2022 වර්ෂයට බලතල පැවරීම සුදුසු බවට යෝජනා කරන ලදී.

**නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය සභාව සතු බලතල ක්‍රියාත්මක කිරීම ගරු සභාපති එස් බී කුමාරදාස මැතිතුමා වෙත පැවරීම**

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 03 වන වගන්තියට අනුව නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය සභාව එම ප්‍රදේශය ඇතුළත පළාත් පාලන ආයතන විය යුතු අතර මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත්, සාමාන්‍යයෙන් එම ප්‍රදේශය ඇතුළත ජනතාවගේ සුඛ විහරණය, පහසුව සහ සුහසාධන යන සියලුම පහසුකම් ආරක්ෂා කිරීමට සහ ප්‍රවර්ධනය කිරීම ඇතුළු ඒ හා සම්බන්ධ සියලු අනුසාංගික කටයුතු විධිමත් කිරීම පාලනය කිරීම හා පරිපාලනය කිරීම පිළිබඳ බලතල පැවරීම එම පනතේ 8(1) වගන්තිය යටතේ ගරු සභාපති එස් බී කුමාරදාස මැතිතුමා වෙත පැවරීම සුදුසු බවට යෝජනා කරමි.

ඉන්ධන හා වාහන අළුත්වැඩියාවන් සඳහා හා කාර්යාලයේ ලිපි ද්‍රව්‍ය මිල දී ගැනීම සඳහා ගරු සභාපතිවරයාට එක් වරකට රු 100,000 සීමාව දක්වා වියදම් කිරීමටත්, මුදල් කමිටුවට රු 20,00,000 දක්වා කර්මාන්ත ගිවිසුම් ගත වීමට හා ප්‍රසම්පාදන ක්‍රියාවලිය තුල භාණ්ඩ හා සේවා මිල දී ගැනීමට බලතල පැවරීම ද සුදුසු බවට යෝජනා කරන ලදී.

**නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය සභාව සතු බලතල ක්‍රියාත්මක කිරීම ලේකම්තුමා වෙත පැවරීම**

නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය සභාවේ ගරු සභාපති එස් බී කුමාරදාස මැතිතුමා විසින් 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ අංක 8 (1) යටතේ තමා වෙත පැවරී ඇති බලතල වලින් එම වගන්තිය ii උප වගන්තිය අනුව මෙම ප්‍රාදේශීය සභාවේ ලේකම් බී.එච් ප්‍රදීප් නිශාන්ත වන අය වෙත පැවරීමට යෝජනා කරමි.

**නැගෙනහිර නුවරගම් පළාතේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කොට්ඨාශයේ සෞඛ්‍ය වෛද්‍ය නිළධාරී වෙත මහජන සෞඛ්‍යයට අදාළ නීති ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය බලය පැවරීම**

මහජන සෞඛ්‍යයට අදාළ රාජකාරිය ඉටු කිරීම සඳහා පහත සඳහන් පනත් හා ආඥා පනත් සහ සංශෝධන වලින් තමා වෙත පැවරී ඇති බලතල සෞඛ්‍ය වෛද්‍ය නිළධාරී වෙත පැවරීමට යෝජනා කරමී.

- 1901 අංක 25 දරණ සුනඛයින් ලියාපදිංචි කිරීමේ ආඥා පනත
- 1893 අංක 7 දරන ජලභීතිකා රෝග නිවාරණ ආඥා පනත
- 1862 අංක 15 දරන පීඩන ක්‍රියා ආඥා පනත
- 1893 අංක 9 දරණ ගෝ ඝාතක ආඥා පනත
- 1897 අංක 03 දරණ රෝග වැළැක්වීමේ හා නිරෝධන ආඥා පනත
- 1946 අංක 57 දරණ පොදු සුසාන භූමි සහ පුද්ගලික සුසාන භූමි පිළිබඳ ආඥා පනත
- 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 4 වන කොටසේ මහජන සෞඛ්‍ය පිළිබඳ පරිච්ඡේදයේ 79 - 104 දක්වා වගන්ති
- 1980 අංක 47 දරන මධ්‍යම පරිසර අධිකාරි පනත
- 1978 අංක 41 දරණ නාගරික සංවර්ධන අධිකාරි පනත

**<u>නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය සභාව සතු බලතල ක්‍රියාත්මක කිරීම ආදායම් පරීක්ෂකවරුන් වෙත පැවරීම</u>**

බල ප්‍රදේශයේ ග්‍රාම නිලධාරී කොට්ඨාශ 34 ට අදාලව ආදායම් එක්රැස් කිරීම සඳහා එම ස්ථානවලට පිවිසීම සහ ආදායම් එකතු කිරීම සඳහා ආදායම් පරීක්ෂකවරුන්හට බලය පැවරීමට යෝජනා කරමි.

**<u>නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය සභාව සතු බලතල ක්‍රියාත්මක කිරීම සඳහා තාක්ෂණ නිළධාරී, තාක්ෂණ සහයක මහතුන් වෙත පැවරීම</u>**

බල ප්‍රදේශයේ සිදු කෙරෙන සියළු සංවර්ධන කටයුතු අධීක්ෂණය සහ ඊට අදාල අනෙකුත් කටයුතු සඳහාද,වීථි රේඛා නිකුත් කිරීම,නොපවරාගැනීමේ සහතික නිකුත් කිරීම,දීර්ඝ කාලීන බදු බලපත්‍ර සඳහා එකඟතාවය ලබාදීම,අනුබෙදුම් සහ මිනින්දෝරු සැලසුම් අනුමත කිරීම ,ගොඩනැගිලි සැලසුම් අනුමත කිරීම,අනුකූලතා සහතික නිකුත් කිරීම,පරිසර බලපත්‍ර නිකුත් කිරීම,ආදී සියළු කාර්යයන් වෙනුවෙන් ස්ථානීය පරීක්ෂණ සිදු කිරීම සහ නිර්දේශ ලබාදීම වෙනුවෙන් එම දේපලවලට පිවිසීම සඳහා තාක්ෂණ නිලධාරීන් සහ තාක්ෂණ සහායක මහතුන්හට බලය පැවරීමටද යෝජනා කරමි.

<u>ගරු මන්ත්‍රී කේ.ඒ ශාන්ත මැතිතුමා</u> 2022 වර්ෂයේ බලතල පැවරීම ඉදිරිපත් කල පරිදි සිදු කිරීම සුදුසු බවට වූ ගරු සභාපතිතුමා කල යෝජනාව ස්ථිර කරන ලදී.

<u>ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා</u> ඉදිරිපත් කල යෝජනාව සම්බන්ධයෙන් යම් විරෝධතාවයක් පවතින්නේද යන්න විමසූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූ බැවින් 2022 වර්ෂයේ බලතල පැවරීමේ යෝජනාව පැමිණ සිටි ගරු සභිකවරුන්ගේ එකඟතාවය මත සභා සම්මත විය.

**05. කමිටු සාමාජිකයන් හා කමිටුවලට අදාල විෂය පථය තීරණය කිරීම.**

<u>ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා</u> 2022 වර්ෂයට අදාලව මෙම ප්‍රාදේශීය සභාව තුල ක්‍රියාත්මක කමිටු වෙනුවෙන් වූ කමිටු සමාජිකයින් හා කමිටුවලට අදාල විෂය පථය පහත සඳහන් පරිදි සුදුසු බවට යෝජනා කරන ලදී.

| මුදල් කමිටුව | | |
|---|---|---|
| 07 | කමිටු සභාපති | ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා |
| | කමිටු සමාජික | ගරු මන්ත්‍රී කේ.ඒ ශාන්ත මැතිතුමා |
| | කමිටු සමාජික | ගරු මන්ත්‍රී බී.ඒ.ජී.එම්.කේ.ජී.ජී කුමාරිහාමි මැතිණිය |
| | කමිටු සාමාජික | ගරු මන්ත්‍රී බී.බී.ඊ ගයාන් චාමර මැතිතුමා |
| | කමිටු සාමාජික | ගරු මන්ත්‍රී ඩී.පී බන්දුලසේන මැතිතුමා |
| | කමිටු සාමාජික | ගරු මන්ත්‍රී වයි.එම් ගාමිණී බණ්ඩාර මැතිතුමා |
| | ලේකම් | බී.එච් ප්‍රදීප් නිශාන්ත මයා |

| පරිසර කමිටුව | | |
|---|---|---|
| 11 | කමිටු සභාපති | ගරු මන්ත්‍රී ජේ.ඒ.ඩී විමලසිරි මැතිතුමා |
| | කමිටු සමාජික | ගරු මන්ත්‍රී ජේ.ඒ ජයවර්ධන මැතිතුමා |
| | කමිටු සමාජික | ගරු මන්ත්‍රී කුමුදු වසන්ති මැතිණිය |
| | කමිටු සමාජික | ගරු මන්ත්‍රී පී කරුණාරත්න මැතිතුමා |
| | කමිටු සාමාජික | පරිසර නිළධාරී 02 |
| | කමිටු සාමාජික | ප්‍රාදේශීය සභාවට අයත් PHI නිළධාරීන් 05 |

| තාක්ෂණ කමිටුව | | |
|---|---|---|
| 7 | කමිටු සභාපති | උප සභාපති එම් සරත් ප්‍රේමචන්ද්‍ර මැතිතුමා |
| | කමිටු සමාජික | ගරු මන්ත්‍රී කේ.ඒ සංජීව මැතිතුමා |
| | කමිටු සමාජික | ගරු මන්ත්‍රී කේ හැරිසෙන්ස් මැතිතුමා |
| | කමිටු සමාජික | ගරු මන්ත්‍රී සුභාෂිණී බංඩාර මැතිතුමා |
| | කමිටු සාමාජික | තාක්ෂණ නිළධාරී ආර්.එම්.සී.ජේ.කේ රාජපක්ෂ මයා |
| | කමිටු සාමාජික | තාක්ෂණ සහයක තරංග නිෂාසිරි මයා |
| | කමිටු සාමාජික | ටී.එච්.ආර් තාරක මයා |

| සැළසුම් කමිටුව | | |
|---|---|---|
| 7 | කමිටු සභාපති | ගරු මන්ත්‍රී කේ.ඒ ශාන්ත මැතිතුමා |
| | කමිටු සමාජික | ගරු මන්ත්‍රී පී.එස්.බී සිරිවර්ධන මැතිතුමා |
| | කමිටු සමාජික | ගරු මන්ත්‍රී පී.ටී සිරිසේන මැතිතුමා |
| | කමිටු සමාජික | ගරු මන්ත්‍රී ආර්.එම්.අයි ශ්‍රීමාලි මැතිණිය |
| | කමිටු සාමාජික | කේ චන්ද්‍රසේකර මිය සංවර්ධන නිළධාරී |
| | කමිටු සාමාජික | ප්‍රජා සංවර්ධන නිළධාරී ආරියරත්න මයා |
| | කමිටු සාමාජික | තාක්ෂණ සහයක තරංග නිෂාසිරි මයා |

| ප්‍රසම්පාදන කමිටුව | | |
|---|---|---|
| 5 | කමිටු සභාපති | ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා |
| | කමිටු සමාජික | ගරු මන්ත්‍රී එම් සරත් ප්‍රේමචන්ද්‍ර මැතිතුමා |
| | කමිටු සමාජික | ගරු මන්ත්‍රී ආර්.එම් කුමාරසිංහ මැතිතුමා |
| | කමිටු සමාජික | ලේකම්බී.එච් ප්‍රදීප් නිශාන්ත මයා |
| | කමිටු සාමාජික | පළාත් පාලන විමර්ෂණ නිළධාරි |

| ළමා හා කාන්තා කමිටුව | | |
|---|---|---|
| | කමිටු සභාපති | ගරු මන්ත්‍රී බී.ඒ.ඩී.එම්.කේ.ජී.ජී කුමාරිහාමි මැතිණිය |
| | කමිටු සමාජික | ගරු මන්ත්‍රී කුමුදු වසන්ති මැතිණිය |
| | කමිටු සමාජික | ගරු මන්ත්‍රී ජී.ඒ නෙළුම් මැතිණිය |
| | කමිටු සමාජික | ගරු මන්ත්‍රී ආර්.එම්.අයි ජනක ශ්‍රීමාලි මැතිණිය |
| 5 | කමිටු සාමාජික | ගරු මන්ත්‍රී සුභාෂිණී බණ්ඩාර මැතිණිය |

**මුදල් හා ප්‍රතිපත්ති කමිටුව (මුදල් කමිටුව)- විෂය පථය**

**01.** රු 50,00,000 දක්වා සියළු ප්‍රසම්පාදන කටයුතු සඳහා අනුමැතිය ලබා දීම.
**02.** ප්‍රසම්පාදන මණ්ඩලය ලෙස කටයුතු කිරීම හා කැඳවීමට නිර්දේශ ලබා දීම
**03.** ගෙවීම් වාර්ථා ආදායම් වියදම් වාර්ථා සම්බන්ධ නිර්දේශය ලබා දීම.
**04.** ඉදි කිරීම් හා සංවර්ධන කටයුතු සම්බන්ධ නිර්දේශ ලබා දීම.

**පරිසර හා පහසුකම් පිළිබද උපදේශක කමිටුව (පරිසර කමිටුව) - විෂය පථය**

**01.** බල ප්‍රදේශයේ පවතින පරිසර ගැටළු සම්බන්ධව මහ සභාවට නිර්දේශ ලබා දීම.
**02.** පරිසර බලපත්‍ර පිළිබද ගැටළු සම්බන්ධ  නිර්දේශ ලබා දීම.
**03.** මහජන සෞඛ්‍ය හා සනීපාරක්ෂක කටයුතු පිළිබද ගැටළු සම්බන්ධ නිර්දේශ ලබා දීම.
**04.** කසල කළමණාකරණය සම්බන්ධ කටයුතු පිළිබද ගැටළු සම්බන්ධ නිර්දේශ ලබා දීම.
**05.** සුසාන භූමි, ක්‍රිඩා පිටි සම්බන්ධ ගැටළු සදහා නිර්දේශ ලබා දීම.

**කාර්මික සේවා සම්බන්ධ උපදේශක කමිටුව (තාක්ෂණ කමිටුව) - විෂය පථය**

**01.** ඉදි කිරීම් සම්බන්ධ ගැටළු වල දී නිර්දේශ ලබා දීම.
**02.** මංමාවත් සම්බන්ධ ගැටළු වල දී නිර්දේශ ලබා දීම.
**03.** වාහන හා යන්ත්‍ර සූත්‍ර සම්බන්ධ ගැටළු වල දී නිර්දේශ ලබා දීම.
**04.** අනවසර ඉදි කිරීම් සම්බන්ධ ගැටළු වල දී නිර්දේශ ලබා දීම.
**05.** වීථි ලාම්පු සම්බන්ධ ගැටළු වල දී නිර්දේශ ලබා දීම.

**නිවාස, ප්‍රජා සංවර්ධන හා සැළසුම් කමිටුව- විෂය පථය**

**01.** ව්‍යාපෘති වාර්ථා සකස් කිරීම සදහා මග පෙන්වීම් හා නිර්දේශ ලබා දීම
**02.** ප්‍රජාව සම්බන්ධ වැඩසටහන් පැවැත්වීමේදී ඊට අදාල නිර්දේශ ලබා දීම
**03.** බල ප්‍රදේශයේ මාර්ග පද්ධතීන්, ආකර්ෂණීයව පවත්වාගෙන යාමට උපදෙස් හා යෝජනා ලබා දීම.
**04.** දීර්ඝ කාලයක සිට අවිධිමත් ලෙස කරන ලද අනවසර ඉදි කිරීම් හේතු කරගෙන පැන නැගී ඇති ගැටළු සම්බන්ධ යෝජනා හා නිර්දේශ ලබා දීම.

<u>ගරු මන්ත්‍රී ආර්.එම් කුමාරසිංහ මැතිතුමා</u> ප්‍රසම්පාදන කමිටුව වෙනුවෙන් තම නාමය ඇතුලත් කර ඇතත් තමාගේ කාර්යබහුලත්වය මත කමිටු වාර සඳහා සහභාගී වීමට නොහැකි බැවින් තම සාමාජිකත්වය වෙනුවට ඩී.පී බන්දුලසේන මැතිතුමා ගේ නාමය ඇතුලත් කිරීම සුදුසු බවට යෝජනා කරන ලදී.

<u>ගරු මන්ත්‍රී පී.කරුණාරත්න මැතිතුමා</u> අදාල යෝජනාව ස්ථිර කරන ලද අතර ඒ අනුව ප්‍රසම්පාදන කමිටුව සඳහා ආර්.එම් කුමාරසිංහ මැතිතුමා වෙනුවට ඩී.පී බන්දුලසේන මැතිතුමා තේරී පත් විය.

<u>ගරු මන්ත්‍රී කේ.ඒ ශාන්ත මැතිතුමා</u>  කමිටු සාමාජිකයින් නම් කිරීම හා කමිටුවල අදාල විෂය පථය සම්බන්ධයෙන් ගෙන ආ යෝජනාව ස්ථිර කරන ලදී.

ර

<u>ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා</u> ඉදිරිපත් කල යෝජනාව සම්බන්ධයෙන් යම් විරෝධතාවයක් පවතින්නේද යන්න විමසූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූ බැවින් කමිටු සමාජිකයින් පත් කිරීමේ හා විෂය පථය තීරණය කිරීමේ යෝජනාව පැමිණ සිටි සියළු මහජන නියෝජිතයන්ගේ එකඟතාවයෙන් සභා සම්මත විය.

**06. වාර්ෂික සැළසුම් අනුමත කිරීම**

<u>ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා</u> 2022 වර්ෂය තුල මෙම ප්‍රාදේශීය සභාවේ ක්‍රියාත්මක කිරීමට නියමිත සැළැසුම් මහ සභාවට ඉදිරිපත් කරමින් ඒ සඳහා සභා අනුමැතිය ලබා දීම සුදුසු බවට යෝජනා කරන ලදී.

01. සංවර්ධන සැළැස්ම 2022
02. ක්‍රියාකාරී සැළැස්ම 2022
03. අපද්‍රව්‍ය කළමණාකරන සැළැස්ම 2022
04. ප්‍රසම්පාදන සැළැස්ම 2022
05. අභ්‍යන්තර විගණන සැළැස්ම 2022
06. පුහුණු සැළැස්ම 2022
07. මානව සම්පත් කළමණාකරණ සංවර්ධන සැළැස්ම 2022

ගරු මන්ත්‍රී ඩී.පී බන්දුලසේන මැතිතුමා ඉදිරිපත් කල සැළසුම් අනුව 2022 වර්ෂයේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමා කල යෝජනාව ස්ථිර කරන ලදී.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා ඉදිරිපත් කල යෝජනාව සම්බන්ධයෙන් යම් විරුද්ධත්වයක් පවතින්නේ ද යන්න විමසූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූ බැවින් 2022 වර්ෂයේ වාර්ෂික සැළැසුම් අනුමත කිරීමේ යෝජනාව පැමිණ සිටි සියළු මහජන නියෝජිතයන්ගේ එකඟතාවයෙන් සභා සම්මත විය.

**07. විගණන කළමණාකරණ කමිටුව පත් කිරීම.**

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා 2022 වර්ෂය වෙනුවෙන් පත් කල යුතුව පවතින් විගණන කළමණාකරණ කමිටුව වෙනුවෙන් කාර්යාලයේ නිළධාරී කණ්ඩායමක් පත් කල යුතු බව ප්‍රකාශ කරමින් ඒ සඳහා වන විගණන කළමනණාකරණ කමිටු සංයුතිය මහ සභාවට ඉදිරිපත් කරන ලද අතර එලෙස විගණන කළමණාකරණ කමිටුව පත් කිරීම සුදුසු බවට යෝජනා කරන ලදී.

කමිටුවේ සංයුතිය:-

01. ගරු සභාපතිතුමා
02. ලේකම්තුමා
03. විගණන දෙපාර්තමේන්තුවේ නිළධාරියා
04. පළාත් පාලන දෙපාර්තමේන්තුවේ විමර්ෂණ නිළධාරී
05. ප්‍රධාන කළමණාකරණ සේවා නිළධාරී
06. සහකාර ගිණුම් නිළධාරී
07. අභ්‍යන්තර විගණන නිළධාරී
08. තාක්ෂණ නිළධාරී

ගරු මන්ත්‍රී බී.ඒ.ජී.එම්.කේ.ජී.ජී කුමාරිහාමී මැතිණිය විගණන කළමණාකරන කමිටුව ඉදිරිපත් කල සංයුතිය අනුව පත් කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමා කල යෝජනාව ස්ථිර කරන ලදී.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා ඉදිරිපත් කල යෝජනාව සම්බන්ධයෙන් යම් විරෝධතාවයක් පවතින්නේද යන්න විමසන ලද අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූ බැවින් 2022 වර්ෂයේ විගණන කළමණාකරන කමිටුව පත් කිරීමේ යෝජනාව පැමිණ සිටි සියළු මහජන නියෝජිතයන්ගේ එකඟතාවයෙන් සභා සම්මත විය.

.

**08. 2009 වර්ෂයට පෙර සිට තහවුරු කර ගැනීමට නොහැකි වූ වගකීම් ආදායමට ගැනීම.**

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය සභාවේ වාර්ෂික මූල්‍ය ප්‍රකාශන වල නිරවද්‍යතාවය තහවුරු කිරීම සඳහා දීර්ඝ කාලයක් තිස්සේ පැවත එන තහවුරු කර

ගැනීමට කිසිදු උපලේඛනයක් නොමැතිව පවතින ගිණුම් ශේෂ අදාල ගිණුම් වලින් කපා හැරීම 2012 වර්ෂයේ විගණන විමසුම් වලින් පෙන්වා දී ඇත.

ඒ අනුව එම ශේෂ 2014 හා 2015 වර්ෂ වල දී එම ශේෂයන් කපා හැරීමට කටයුතු කර ඇති නමුත් එම ශේෂ කපා හැරීම සඳහා විධිමත් පරිදි අවසර ගෙන නොමැති බව 2014 හා 2015 වර්ෂ වල විගණන විමසුම් වලින් පෙන්වා දී ඇත. ඒ අනුව 2019.11.05 දින පළාත් පාලන කොමසාරිස්තුමියගේ ප්‍රධානත්වයෙන් පැවති විගණන හා කළමණාකරන කමිටුවේදී එම ශේෂයන් නැවත ගිණුමට ඇතුළත් කර නිසි අවසරයකින් කපා හැරීමට අනුමැතිය ලබා ගත යුතු යැයි නිර්දේශ කරන ලදී. ඒ අනුව සාධාරණීකරණ වාර්ථාවක් ද සකස් කර 2019.11.22 පැවති මහ සභාව වෙත එම වාර්ථාව ඉදිරිපත් කර තීරණ අංක ඉ)118 යටතේ යෝජනා සම්මත කර ආණ්ඩුකාරවරයා වෙත අනුමැතියට යැව්වද, එය නිලධාරින් තුන් දෙනෙකුගෙන් සමන්විත කමිටුවක් පත්කර ඉන් ලබා දෙන නිර්දේශ සමඟ නැවත එවන ලෙස දන්වා ඇති නමුත් ප්‍රාදේශීය සභාවකට සභා අනුමැතිය යටතේ ඉල්ලූ විට නැවත ගෙවීමට යටත්ව යම් වගකීමක් ආදායමට ගැනීමේ හැකියාවක් පවතින බැවින්, ඒ පදනමින් පහත සඳහන් වගකීම් ඉදිරියේදී ඕනෑම අවස්ථාවක නිදහස් කිරීමට යටත්ව ආදායමට ගැනීම සඳහා මහ සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බවට යෝජනා කරන ලදී.

**01.රු.234,725.72**

මෙම ශේෂය 2008 වර්ෂයේ සිට ශේෂ පත්‍රයේ වගකීමක් ලෙස දක්වා ඇතත් ඒ පිළිබඳ කිසිදු උප ලේඛනයක් නොමැත.

**02.රු.154,843.10**

මෙම ශේෂය 2008 වර්ෂයේ සිට පොදු ගිණුම ලෙස ශේෂ පත්‍රයේ වගකීමක් ලෙස දක්වා ඇතත් ඒ පිළිබඳ කිසිදු උප ලේඛනයක් නොමැත.

**03.රු.12,199.83**

මෙම ශේෂය 2008 වර්ෂයේ සිට සංවර්ධන සහා ඉතිරි ලෙස ශේෂ පත්‍රයේ වගකීමක් ලෙස දක්වා ඇතත් ඒ පිළිබඳ කිසිදු උප ලේඛනයක් නොමැත.

**04.රු.8,900.00**

මෙම ශේෂය 2008 වර්ෂයේ සිට පුස්තකාල තැන්පතු ලෙස ශේෂ පත්‍රයේ වගකීමක් ලෙස දක්වා ඇතත් ඒ පිළිබඳ කිසිදු උප ලේඛනයක් නොමැත.

**05.රු.7,500.00**

මෙම ශේෂය 2008 වර්ෂයේ සිට විවිධ තැන්පතු ලෙස ශේෂ පත්‍රයේ වගකිමක් ලෙස දක්වා ඇතත්, ඒ පිළිබඳ කිසිදු උප ලේඛනයක් නොමැත.

**06. රු.11,750.00**

මෙම ශේෂය 2008 වර්ෂයේ සිට ශේෂ පත්‍රයේ වගකිමක් ලෙස දක්වා ඇතත්, ඒ පිළිබඳ කිසිදු උප ලේඛනයක් නොමැත.

ගරු මන්ත්‍රී කේ.ඒ ශාන්ත මැතිතුමා අදාල වගකීම් ඉදිරියේදී ඕනෑම අවස්ථාවක නිදහස් කිරීමට යටත්ව ආදායමට ගැනීම සඳහා මහ සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු සභාපතිතුමා කල යෝජනාව ස්ථිර කරන ලදී.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා ඉදිරිපත් කල යෝජනාව සම්බන්ධයෙන් විරෝධතාවයක් පවතින්නේ ද යනත් විමසන ලද අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූ බැවින් වගකීම් ඉදිරියේදී ඕනෑම අවස්ථාවක නිදහස් කිරීමට යටත්ව ආදායමට ගැනීම සඳහා මහ සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු වට වූ යෝජනාව පැමිණ සිටි ගරු සභිකවරුන්ගේ එකඟතාවයෙන් සභා සම්මත විය.

### 09. 2022 වර්ෂයේ මහ සභාව හා කමිටු පැවැත්වෙන දින ඇතුලත් කාල සටහන ඉදිරිපත් කිරීම

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා 2022 වර්ෂයේ මහ සභාව හා කමිටු පැවැත්වීමේ දින ඇතුලත් කාල සටහන මහ සභාවට ඉදිරිපත් කරමින් කාල සටහනට අදාලව රැස්වීම් පැවැත්වීම සුදුසු බවට යෝජනා කරන ලදී.

| මාසය | මහ සභාව | මුදල් කමිටුව | පරිසර උපදේශක කමිටුව | සැළසුම් උපදේශක කමිටුව | තාක්ෂණික උපදේශක කමිටුව | උපදේශක කාරක සභාව |
|---|---|---|---|---|---|---|
| ජනවාරි | **2022.01.18** | **2022.01.07** | **2022.01.20** | | | |
| පෙබරවාරි | **2022.02.17** | **2022.02.08** | | | | **2022.02.21** |
| මාර්තු | **2022.03.22** | **2022.03.08** | | **2022.03.18** | **2022.03.18** | |
| අප්‍රේල් | **2022.04.22** | **2022.04.07** | | | | |
| මැයි | **2022.05.17** | **2022.05.06** | | | | **2022.05.20** |
| ජූනි | **2022.06.17** | **2022.06.07** | **2022.06.21** | **2022.06.21** | | |
| ජූලි | **2022.07.19** | **2022.07.07** | | | | |
| අගෝස්තු | **2022.08.19** | **2022.08.09** | | | | **2022.08.23** |
| සැප්තැම්බර් | **2022.09.16** | **2022.09.07** | **2022.09.20** | | **2022.09.20** | |
| ඔක්තෝම්බර් | **2022.10.18** | **2022.10.07** | | | | **2022.10.20** |
| නොවැම්බර් | **2022.11.18** | **2022.11.08** | | | | |
| දෙසැම්බර් | **2022.12.16** | **2022.12.09** | | **2022.12.20** | | |

ගරු මන්ත්‍රී කේ.ඒ ශාන්ත මැතිතුමා ගරු සභාපතිතුමා ඉදිරිපත් කළ කාල සටහනට අනුව මහ සභාව හා කමිටු පැවැත්වීමේ යෝජනාව ස්ථිර කරන ලදී.

ගරු මන්ත්‍රී කේ හැරිසෙන්ස් මැතිතුමා උපදේශක කාරක සභා රැස්වීමේ සංයුතිය වෙනසක් සිදු වන්නේ නැතිද යන්න විමසන ලදී.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා මේ වසර තුල සියළුම ගරු මන්ත්‍රීවරුන් උපදේශක කාරක සභාව නියෝජනය කරන සේම බල ප්‍රදේශයේ ස්වෙච්ඡා සංවිධාන ප්‍රධානීන් හා විශේෂ වෘත්තිකයන්ද මේ සඳහා ගෙන්වා ගැනීමට අපේක්ෂාවෙන් සිටින බවත්, ඉදිරියේදී රැස්වීම් පිළිබඳව දැනුම් දෙන අතරම තම කොට්ඨාශය තුල හෝ තමන් උපදේශක කමිටුව නියෝජනය කිරීමට සුදුසුයි යන්න අදහස් කරන පුද්ගලයින්ගේ නම් ලබා දීමට කටයුතු කරන ලෙසද ඉල්ලා සිටි අතර, ඉදිරිපත් කල යෝජනාව සම්බන්ධයෙන් යම් විරෝධතාවයක් පවතින්නේද යන්න විමසූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූ බැවින් ඉදිරිපත් කර ඇති 2022 වර්ෂයට අදාල කාල සටහනට අනුව මහ සභාව හා කමිටු පැවැත්වීමේ යෝජනාව පැමිණ සිටි සියළු මහජන නියෝජිතයන්ගේ එකඟතාවයෙන් සභා සම්මත විය.

**10.** **මහ ඇල අසලට මුහුදු මාළු ලැල්ලක් ස්ථාපනය කිරීම.**

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා පන්සල පාර, කීරික්කුලම, ගල් කුලම ලිපිනයේ පදිංචි කුඩා නෙළුම්කුලම මහ ඇල අසල වැව් මාළු ලැල්ල පවත්වාගෙන යනු ලබන ඩබ්.බී.එම් ඩී.පී.කේ කරුණාරත්න යන අය විසින් එම ස්ථානයට තවත් මුහුදු මාළු ලැල්ලක් අවශ්‍ය බවට ඉල්ලුම් කර ඇති බැවින් එම ස්ථානයේ මුහුදු මාළු ලැල්ලක් ස්ථාපනය කිරීම සුදුසු බවට යෝජනා කරන ලදී.

ගරු මන්ත්‍රී කේ.ඒ ශාන්ත මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදී.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා ඉදිරිපත් කල යෝජනාව සම්බන්ධයෙන් යම් විරෝධතාවයක් පවතින්නේ ද යන්න විමසන ලද අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූ බැවින් කුඩා නෙළුම්කුලම මහ ඇල අසලට මුහුදු මාළු ලැල්ලක් ස්ථාපනය කිරීමේ යෝජනාව පැමිණ සිටි සියළු මහජන නියෝජිතයන්ගේ එකඟතාවයෙන් සභා සම්මත විය.

**11.** **ශ්‍රාවස්තිපුර කඩ කාමර වල තක්සේරු මුදල සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.**

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා නැ.නු.ප ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ නාච්චාදූව ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයට අයත් ශ්‍රාවස්තිපුර කඩ කාමර 12 සඳහා මේ වන විට තක්සේරු දෙපාර්තමේන්තුව විසින් මාසික තක්සේරුව රු 2500.00 ලෙසට දන්වා ඇති බැවින් එම තක්සේරු මුදල පදනම් කරගනිමින් මාසික කුලිය අය කිරීම සුදුසු බවට යෝජනා කරන ලදී.

ගරු මන්ත්‍රී ආර්.එම් කුමාරසිංහ මැතිතුමා ජනතාව මේ වන විට මුහුණ දී ඇති ආර්ථික ප්‍රශ්ණ හමුවේ බදු වැඩි කිරීම කසිසේත් අනුමත කල නොහැකි බව ප්‍රකාශ කරමින් කුලිය වැඩි කිරීම සම්බන්ධව සිය විරෝධතාවය ඉදිරිපත් කරන ලදී.

ගරු මන්ත්‍රී කේ.ඒ සංජීව මැතිතුමා ශ්‍රාවස්තිපුර කඩ කාමර තක්සේරු දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කර ඇති මාසික තක්සේරුව මත මාසික කුලිය අනුමත කිරීම සුදුසු බවට ගරු සභාපති තුමා විසින් ගෙන ආ යෝජනාව ස්ථිර කරන ලදී.

ගරු මන්ත්‍රී ඩී.පී බන්දුලසේන මැතිතුමා ප්‍රාදේශීය සභාවට බදු වැඩි කිරීමට හා බදු නොගෙවීම මත වංචල දේපල වුවද අත්පත් කර ගැනීමේ හැකියාව පවතින බව දීර්ඝ ලෙස කරුණු දක්වමින් සඳහන් කරන ලදී.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා ඉදිරිපත් කල යෝජනාව සම්බන්ධයෙන් යම් විරෝධතාවයක් පවතින්නේ ද යන්න විමසන ලද අතර යෝජනාව සම්බන්ධයෙන් විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූ බැවින් ශ්‍රාවස්තිපුර කඩ කාමර තක්සේරු දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කර ඇති මාසික තක්සේරුව මත මාසික කුලිය අය කිරීම සුදුසු බවට වූ යෝජනාව පැමිණ සිටි සියළු මහජන නියෝජිතයන්ගේ එකඟතාවයෙන් සභා සම්මත විය.

**12.** **2020 වර්ෂයට ලබා දුන් ඇස්තමේන්තු ආදායම් අය කිරීම නොහැකි වීම මත ඒ සඳහා සහනයක් ලබා දීම.**

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා 2020 වර්ෂයට අය කල යුතු ව්‍යාපාර බදු හා කර්මාන්ත බදු පිළිවෙළින් රු 1,890,000.00 ක් හා රු 130,000 ක් වන බවත්, 2020 වර්ෂය අවසන් වන විට මෙමෙ ඇස්තමේන්තු ගත මුදල් ඉක්මවා ව්‍යාපාර බදු රු 2,071,560 ක් හා කර්මාන්ත බදු රු 136,250.00 ක මුදලක් ආදායම ලෙස එකතු කර ඇති නමුත් අවසන් ගිණුම් සකස් කිරීමේදී ඇස්තමේන්තු ගත මුදල් ඉක්මවා අයකර තිබුනද සමීක්ෂණය මගින් සිදු කල ගෙවීම් නොකළ සියළු ව්‍යාපාරික ස්ථාන අවසන් ගිණුම වෙත හිඟ ව්‍යාපාරික ස්ථාන ලෙස පෙන්වා ඇත.

මෙලෙස ව්‍යාපාර හා කර්මාන්ත බදු සැළකිල්ලට ගෙන වැඩිපුර අය කර තිබියදීත් කොරෝනා වසංගත සමයේ අනවසර වෙළඳ සැල් සමීක්ෂණය කර අයදුම්පත්‍ර භාර දී තිබු බැවින් ඒවා ලේඛන ගත කිරීමෙන් නැවත අය කර ගැනීමට යාමේදී වෙළඳසැල් වසා තිබීම නිසා ව්‍යාපාර බදු හා කර්මාන්ත බදු හිඟය 2020 වර්ෂයට රු 365,520.00 ක් පෙන්වා දුන් නමුත් එම මුදලින් අද දින දක්වා රු 86,000.00 එකතු කර ඇත. ඉතිරි මුදල් අය කර ගැනීමේදී වෙළඳසැල් හිමියන් විසින් පවසන ලද්දේ කොරෝනා වසංගත සමයේ බොහෝ ව්‍යාපාර වසා ඇති බවත්, එම මුදල් ඔවුනට ගෙවීමට නොහැකි වී ඇති බැවින් මුදල් අය කර ගැනීම අපහසු බැවින් 2020 වර්ෂයට ඇස්තමේන්තු මුදලට වඩා අය කර ඇති නමුදු එම හිඟ මුදල් අය කිරීම සම්බන්ධව නඩු පැවරීමක් කිරීමට නොහැකි බැවින් සහනයක් ලබා දෙන මෙන් ආදායම් පරීක්ෂක විසින් ඉල්ලා ඇති බැවින් ඒ සඳහා සහනයක් ලබා දීම සුදුසු බවට යෝජනා කරන ලදී.

<u>ගරු මන්ත්‍රී කේ.හැරිසෙන්ස් මැතිතුමා</u> වසා ඇති බව සනාථ කරගනිමින් අදාල හිඟය කපා ඉවත් කල නොහැකිද යන්න විමසන ලදී.

<u>ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා</u> මෙම තත්වය සඳහා කොවිඩ් වසංගත තත්වය හේතු වී ඇති බැවින් මෙම වෙළඳ ආයතන සඳහා නඩු පැවරීමකින් තොරව නිදහස් කර ගත යුතු බවත්, ඒ සඳහා ග්‍රාම නිළධාරී සහතිකයක් ලබා ගැනීම සුදුසු බවත් ප්‍රකාශ කරන ලදී.

<u>ගරු මන්ත්‍රී ඩී.පි බන්දුලසේන මැතිතුමා</u> ව්‍යාපාර ස්ථානය වර්ෂය තුල වසා දමා ඇත්නම් ඒ පිළිබඳව එම ප්‍රදේශයේ ග්‍රාම නිළධාරීතුමාගේ සහතිකයක් ලබා ගැනීමෙන් නිදහස් කිරීමටත්, ආදායම් නොලැබීම මත ගෙවීම් කල නොහැකි පිරිස් සිටින්නේ නම්, ඒ සඳහා 50% ප්‍රතිශතයකින් සහනයක් ලබා දීමටත් තව දුරටත් අය කල යුතු අනවසර වෙළඳ ව්‍යාපාර කිසිසේත්ම හඳුනාගැනීමට නොහැකි බැවින් ඒවා සම්පූර්ණයෙන්ම හිඟ ආදායමින් නිදහස් කිරීම සුදුසු බව ප්‍රකාශ කරමින් ගරු සභාපතිතුමා විසින් ගෙන ආ යෝජනාව ස්ථිර කරන ලදී.

<u>ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා</u> ඉදිරිපත් කල යෝජනාව සම්බන්ධයෙන් යම් විරෝධතාවයක් පවතින්නේ ද යන්න විමසූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූ බැවින් 2020 වර්ෂයට ලබා දුන් ඇස්තමේන්තු ආදායම් අය කිරීම නොහැකි වීම මත ඒ සඳහා සහනයක් ලබා දීමේ යෝජනාව පැමිණ සිටි ගරු සභිකවරුන්ගේ එකඟතාවය මත සභා සම්මත විය.

**13. දිවා සුරුකුම් මධ්‍යස්ථාන පාලිකාව වෙත දෛනික දීමනාවක් ලබා දීම.**

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා දැනට දිවා සුරැකුම් මධ්‍යස්ථාන පාලිකාව ලෙස කටයුතු කරන මානෙල් පුෂ්පකාන්ති මිය 2018.05.01 වන දින සිට සභාවේ රාජකාරි ඉටු කරන නමුත් මෙතෙක් සභාවෙන් කිසිදු වැටුපක් හෝ දීමනාවක් ගෙවා නොමැති අතර දිවා සුරැකුම් මධ්‍යස්ථානයේ දරුවන්ගෙන් ලැබෙන ආදායම නැවත ඇය වෙත ගෙවන නමුත් දරුවන්ගේ පැමිණීමේ පවතින ගැටළු මත හා දැනට හිමි වන දීමනාව ඉතාමත් අවම වන බැවින් ඇයට දෛනික දීමනාවක් හෝ ලබා දීමට පියවර ගන්නා ලෙස ඉල්ලා සිටින බැවින් සභා සේවකයෙකු ලෙස දෛනික වැටුප් ලබා දෙමින් සේවයට බඳවා ගැනීම සුදුසු බවට යෝජනා කරන ලදී.

<u>ගරු මන්ත්‍රී ඩී.පී බන්දුලසේන මැතිතුමා</u> වසර ගණනාවක් සේවය කල සේවිකාවක් , සුදුසකම් නොමැතිව වුවද නොගැලපෙන තනතුරකට යොමු කලත්, සානුකම්පිත හේතූන් සලකා බලා සුදුසු තනතුරකට ආදේශක පදනමින් බඳවා ගැනීම සුදුසු බව සඳහන් කරමින් ගරු සභාපතිතුමා ගෙන ආ යෝජනාව ස්ථිර කරන ලදී.

<u>ගරු මන්ත්‍රී ආර්.එම් කුමාරසිංහ මැතිතුමා</u> සභාවේ දැනට ස්ථිර නොවූ අනියම් සේවකයින් 18 දෙනෙකු සිටින අතර මේ වන විට සේවා කාලය වසර 5,6 ඉක්මවූවන් සිටින බවත්, ඔවුන්ගේ හොඳම කාලය මෙලෙස නහස්තිවීම තුල ඔවුන්ගේ විශ්‍රාම වැටුප, මානසික තත්වය, පවුල් ගැටළු ආදී ගැටළු පැන නගින බැවින් සභාවක් ලෙස ද මේ සඳහා සාධනීය මැදිහත් වීමක් සිදු කරන ලෙසත් ස්ථිර කිරීමේ වැළපිළිවෙල කඩිනමින් ආරම්භ කරන ලෙසත් ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා ඉදිරිපත් කල යෝජනාව සම්බිනධයෙන් යම් විරෝධතාවයක් පවතින්නේ ද යන්න විමසන ලද අතර යෝජනාව සම්බන්ධයෙන් කිසිදු විරෝධතාවයක් ඉදිරිපත් නොවූ බැවින් දිවා සුරැකුම් පාලිකාව ලෙස කටයුතු කරන මානෙල් පුෂ්පකාන්ති මිය වෙත දෛනික දීමනාවක් ගෙවීමේ යෝජනාව පැමිණ සිටි ගරු සභිකවරුන්ගේ එකගතාවය මත සභා සම්මත විය.

**14. රෝද පුටු, අත්වාරු හා කිහිලි කරු මිල දී ගැනීම.**

ගරු මන්ත්‍රී වයි.එම් ගාමිණී බංඩාර මැතිතුමා ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ජනතාවගේ අවශ්‍යතාවයන්ට අනුව ලබා දිය හැකි වන පරිදී රෝද පුටු 02 ක් හා කිහිලි කරු 02 ක්ද, අත්වාරු 01 ක්ද මිල දී ගැනීම පුසුදු බවට යෝජනා කරන ලදී.

තවද අවශ්‍යතාවය අනුව ලබා ගත් යම් පුද්ගලයෙකු අදාල අවශ්‍යතාවය ඉටු කර ගැනීමෙන් පසුව නැවත භාර ගැනීමට කටයුතු කල යුතු බවද සඳහන් කරන ලදී.

ගරු මන්ත්‍රී ඩී.පී බන්දුලසේන මැතිතුමා මෙම අවශ්‍යතාවය වෙනුවෙන් සමාජ සේවා දෙපාර්තමේන්තුවේ සහයෝගය ලබා ගත හැකි වන බවත්, ඊට අදාලව එම ආයතනය මගින් නිකුත් කරන අයදුම්පත්‍රයක් සභාව වෙත ලබා ගෙන අවශ්‍යතාවය අනුව සභාවෙන් අදාල ඉල්ලීම් ඉටු කර දීම සුදුසු බව සඳහන් කරන ලදී.

ගරු මන්ත්‍රී කේ හැරිසෙන්ස් මැතිතුමා සමාජ සේවා දෙපාර්තමේන්තුව හරහා අදාල උපකරණ ලබා ගත හැකි වූවත් හදිසි අවශ්‍යතාවයට එලෙස ලබා ගත නොහැකි බැවින් අදාල උපකරණ මිල දී ගැනීම සඳහා ගෙන ආ යෝජනාව ස්ථිර කරන ලදී.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා ඉදිරිපත් කල යෝජනාව සම්බන්ධයෙන් යම් විරෝධතාවයක් පවතින්නේ ද යන්න වමසන ලද අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූ බැවින් ප්‍රාදේශීය සභාව වෙනුවෙන් රෝද පුටු 02 ක් හා කිහිලි කරු 02 ක්ද, අත්වාරු 01 ක්ද මිල දී ගැනීම සම්බන්ධයෙන් වන යෝජනාව පැමිණ සිටි ගරු සභිකවරුන්ගේ එකඟතාවය මත සභා සම්මත විය.

**ඊ) කාරක සභාවල වාර්තා**

- 2021 දෙසැම්බර් මස 09 වන දින මුදල් කමිටු වාර්ථාව

**සභා ගත කරන ලදී.**

ගරු මන්ත්‍රී ආර්.එම් කුමාරසිංහ මැතිතුමා 2021.11.12 මුදල් කමිටු වාර්ථාවේ අභල් 08 හා අභල් 18 පළල හියුම් පයිප්ප මිල දී ගැනීම වෙනුවෙන් මිල ගණන් කැඳවීම සිදු කර ඇති බැවින් ඒ සම්බන්ධව අවධානය යොමු කරන ලෙසත්,

2021.12.09 වන දින මුදල් කමිටුවේ විදුලි පන්දම් එකක මිල රු 7,050 ලෙස සටහන් කර ඇතත්, එහි විදුලි පන්දම් 03 හිම මිල එය විය යුතු බැවින් එය සංශෝධනය විය යුතු බවත්, ඇණ හා කොකු අවශ්‍ය ප්‍රමාණය 300 ක් අවශ්‍ය වූවත්, එහි ඒකකයක මිල නොව කිලෝ ග්‍රෑම් 01 ක මිල ලෙසට සටහන් කල යුතු බව සඳහන් කරන ලදී.

තවද ඇස්බැස්ටෝ ශීට් හි වර්ගය සඳහන් කර නොමැති බවත්, එයද සටහන් විය යුතු බව සඳහන් කරන ලදී.

**එ) ලැබීම් ගෙවීම් මාසික වාර්තා**

2021 නොවැම්බර් මස ආදායම් හා වියදම් වාර්ථා මහ සභාවේ සලකා බැලීම සිදු කරන ලදී.

**ඒ) රැස්වීම් කැඳවීමේ දැන්වීම් හා වෙනත් කාරණා ඉදිරිපත් කිරීම.**

**01. නිවාඩු දැනුම් දීම.**

<u>ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා</u> ගරු මන්ත්‍රී බී.බී.ජී ගයාන් චාමර මැතිතුමා, ගරු මන්ත්‍රී පී.ටී සිරිසේන මැතිතුමා ,ගරු මන්ත්‍රී එස්.ඒ.කේ.පී ගුණවර්ධන මැතිතුමා මහ සභාවට නොපැමිණෙන බවට දන්වා යොමු කර තිබූ නිවාඩු ඉල්ලීම් මහ සභාවට ඉදිරිපත් කරන ලදී.

<u>ගරු මන්ත්‍රී කේ.ඒ ශාන්ත මැතිතුමා</u> අදාල නිවාඩු ඉල්ලුම් කර ඇති ගරු සභිකවරුන් වෙත නිවාඩු ලබා දීම සුදුසු බව සඳහන් කරන ලදී.

<u>ගරු මන්ත්‍රී ආර්.එම් කුමාරසිංහ මැතිතුමා</u> වන අලි ගැටළුවට විසඳුමක් ලෙස ඉදි කරනු ලබන අඟල අමාත්‍යවරයාගේ අනුමැතිය ඇතිව සිදු කරන නමුත් අඟල ඉදි කිරීමත් සමඟ අලින් වදාකඩ. ගල්වඩුවාගම, කිඹුලාකඩ, කොඩිගල, වීරවැව ප්‍රදේශයට ගොස් හේන් හා අනෙකුත් වගාවන් විනාශ කරගෙන යන බැවින් එම ප්‍රදේශයද අඟල් කැපිය යුතු බවත්, මේ තුල සිදු වන පරිසර හානිය ඉතා විශාල වන අතරම අඟල් කැපීමෙන් ඉවත් වන පස් ජලය ගලා යන ස්ථාන වලට බැම්මක් ලෙස සකස් කල හැකිව තිබූ මුත් රාජ්‍ය ආයතන කිහිපයකම දැනුවත් වීමකින් තොරව සිදු කරන කූට තීරණ තුලින් පස් සියල්ල කපා විකිණීම සිදු කරන බවත්, මේ තුල සිදු වන මහා විනාශය වැළැක්විය යුතු වන අතරම අදාල පස් විකිණීම සිදු කරන්නේ නම් එහි ආදායම ප්‍රාදේශීය සභාවට හිමි විය යුතු බවත්, අඟල ඉදි කිරීම තුල කුඩා සිවුපාවුන්ට වන හානියද අති මහත් බවත්, සඳහන් කරන ලදී.

තවද මෙම දැවැන්ත ක්‍රියාවලිය පසෙකලා සිදු කරන අක්‍රමිකතාවය වහාම නතර කර කඩිනම් මැදිහත්වීමක් සිදු කරන ලෙස දීර්ඝ ලෙස කරුණු දක්වමින් ප්‍රකාශ කරන ලදී.

තවද කඩ කාමර වල භූමියේ අයිතිය පවතින ගැටළුව මේ වන විට විසඳී ඇත්ද යන්නත්, තරියන්කුලම ප්‍රදේශයේ කොම්පෝස්ට් පොහොර මධ්‍යස්ථානයක් ඉදි කිරීමට යෝජනා වී ඇතත්, අපට අයත්ව තිබූ කීරික්කුලම ප්‍රදේශයේ කොම්පෝස්ට් අංගනය තුලින්ම අදාල ව්‍යාපෘතිය ආරම්භ කිරීමට සැළසුම් කලානම් දැනට තරියන්කුලම ප්‍රදේශයේ ඉදි කිරීමට නියමිත ගොඩනැගිල්ල, ජලය, විදුලිය ආ අනෙකුත් ද්‍රව්‍ය හා උපකරණ මිල දී ගන්නවා වෙනුවට අවශ්‍ය නවීන පන්නයේ මැෂින් පමණක් මිල දී ගෙන කීරික්කුලම ව්‍යාපෘතිය නැවත ක්‍රියාත්මක කිරීමේ හැකියාව පැවති බවත් කරුණු දක්වමින් සඳහන් කරන ලදී.

තවද කළු ආරච්චියාගම ප්‍රදේශයේ LRC ව්‍යාපෘතිය යටතේ ආරම්භ කල කොම්පෝස්ට් ව්‍යාපෘතිය තුල ද දක්නට ලැබෙන්නේ ඉතාම කණගාටුදායක තත්වයක් බවත් එහි අන්තර්ගතය තුල දහයියා, බොරළු හා සැල්විනියා පමණක් බවද දීර්ඝ ලෙස කරුණු දක්වමින් සඳහන් කරන ලද අතර ඒ තුල විශාල මුදලක් නාස්ති වන බවද සඳහන් කරන ලදී.

<u>ගරු මන්ත්‍රී කේ.ඒ සංජීව මැතිතුමා</u> මේ වන විට සවි කර ඇති අලි වැටට සමාන්තරව මෙම අඟල ඉදි කරන බැවින් එම අඟල ඉදි කිරීමට ප්‍රථම සිට අලි ගම් වැදීම සිදු වූ බවත්, මෙය 100% හරි බවට සඳහන් නොකරනවා වුවත්, අඟල් ඉදි කිරීම යනු අලි තර්ජනය වෙනුවෙන් ලංකාව තුල ක්‍රියාත්මක කරන වැඩපිළිවෙලක් බවත්, කරුණු දක්වමින් සඳහන් කරන ලදී.

එම අවස්ථාවේදී ගරු මන්ත්‍රී ආර්.එම් කුමාරසිංහ මැතිතුමා හා ගරු මන්ත්‍රී කේ.ඒ සංජීව මැතිතුමා අතර ඇති වූ අදහස් හුවමාරුව හමුවේ ඇති වූ ගෝෂාකාරී තත්වය හේතුවෙන් සිදු කල ප්‍රකාශ කිසිවක් පැහැදිලි නොවිණි.

<u>ගරු මන්ත්‍රී ඩී.පී බන්දුලසේන මැතිතුමා</u> පොදු කාරණයක් සම්බන්ධයෙන් පෞද්ගලික ආරවුලක් ඇති කර ගැනීම සුදුසු නොවන බව ප්‍රකාශ කරමින් මේ වන විට අඩි 10 ක් ගැඹුරින් හා පළලින් කපන අඟල මගින් ඉවත්

කරන පස් විකුණා අහල් කැපීම වැය වන මුදල ලබා ගන්නා නමුත් මෙලෙස කපාගෙන යන අවස්ථාවේදී කළු ගලක් හමු වුවහොත් එයද ඉවත් කිරීමට කටයුතු කල යුතු බවත්, එසේ නොකිරීම තුල මෙම කාර්යය ආර්ථික වාසි අරබයා සිදු කරන කාර්යයක් බවට පිළිබිඹු වන බවත්, මේ අහල කැපීම තුල ස්වාභාවික ජලය ගලා යන මාර්ග අවහිර වන බවත්, ප්‍රාදේශීය සභා පනත ප්‍රකාරව ඒ සඳහා කිසිසේත්ම ඉඩ දිය නොහැකි බවත්, මෙම අහල ඉදි කිරීම තුල කුඩා වන සතුන්ට හානි වන අතරම පාරිසරික ගැටළු ගණනාවක් ඇති වන බවත්, මෙ සඳහා සභාවක් ලෙස සෑම ගරු මන්ත්‍රීවරයෙකුම ජනතාවගේ පැත්තෙන් කරුණු දැක්වීම හා ක්‍රියා කිරීම අනිවාර්යෙන් සිදු කල යුතු බව දීර්ඝ ලෙස කරුණු දක්වමින් සඳහන් කරන ලදී.

<u>ගරු උප සභාපති එම් සරත් ප්‍රේමචන්ද්‍ර මැතිතුමා</u> ජනතාවගේ ජීවිත වලට හා වගාවන්ට සිදු වන හානි වලක්වා ගැනීම අරමුණු කරගනිමින් තමන් වල අලි ගැටළුව සම්බන්ධව යෝජනාව ඉදිරිපත් කල බවත්, වසර ගණනාවක ඉල්ලීම් හමුවේ මෙලෙස වන අලි ගැටළුව සඳහා අහලක් ඉදි කිරීම මෙම ප්‍රදේශය තුල සිදු කිරීම සඳහා අනුමැතිය හිමි වුවද මීට දින 10 කට පෙර යම් පුද්ගලයෙකු විසින් රජය කිසිදු වියදමකින් තොරව සංවර්ධනය වෙනුවෙන් අවශ්‍ය පස් හා බොරළු ලබා දෙමින් තම වියදම පියවා ගැනීමට කැමැත්ත දක්වා මෙම අහල කැපීම සිදු කරන බවත්, එහිදී අලි වැටට මීටර් 15 ක් එහායින් අඩි 10 ගැඹුරන් හා අඩි 10 පළලින් මීටර් 200 කට වරක් කුඩා වන සතුන්ට ගොඩ වීමට හැකි වන පරිදී කැලය වෙතට අහල් ඉදි කිරීම මෙන්ම ස්වාභාවික ජලය ගලා යන ස්ථාන වලට අවහිර නොවන ලෙස අහල් කැපීමට භූ විද්‍යා හා පතල් කාර්යංශයෙන් උපදෙස් ලබා දී ඇති නමුත් මෙය සභාවට කිසිදු දැනුවත් කිරීමකින් තොරව සිදු කිරීම වැරදි සහගත බවත්, මෙය විධිමත් කිරීම සඳහා වැඩපිළිවෙලක් දියත් කිරීමට ගරු සභාපතිතුමා සමඟ සාකච්ඡා කල බව සඳහන් කරන ලදී.

<u>ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා</u> මෙම ගැටළුව සමබන්ධයෙන් ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේදී තමන් සාකච්ඡා කල බවත්, අදාල පස් කැපීම සිදු කරන පුද්ගලයන්ට පෞද්ගලිකව කතා කර සභාවට පැමිණ මේ සම්බන්ධයෙන් විධිමත් භාවයක් ඇති කර ගන්නා ලෙසට ප්‍රකාශ කල නමුත් මෙතෙක් ඔහු නොපැමිණි බවත්, වන ජීවී කාර්යාලය විසින් මෙම පස් කැපීමේ කාර්යය සියළු ආයතන වලට දැනුවත් කල බවට තරයේ ප්‍රකාශ කර සිටි බවත්, එහිදී ප්‍රාදේශීය සභාව දැනුවත් කල යුතු බවට ඔවුන් නොදන්නා බවටත් ප්‍රකාශ කල බවත්, එහිදී මේ සම්බන්ධයෙන් සභාව සතුව පවතින බලය සම්බන්ධයෙන් තමන් ආදාල ආයතන දැනුවත් කර මෙය තව දුරටත් නිවැරදි කිරීම සඳහා දින කිහිපයක් අවස්ථාව ලබා දෙන බවටත් එසේ නොකරන්නේ නම් මේ සම්බන්ධව නීතිමය පියවර ගැනීමට කටයුතු කරන බව සඳහන් කරන ලදී.

<u>ගරු මන්ත්‍රී ඩී.පී බන්දුලසේන මැතිතුමා</u> මේ කාර්යය සම්බනධයෙන් ප්‍රාදේශීය සභාවක් ලෙස කල යුතුව පවතින්නේ අදාල පස් කපන පුද්ගලයා සමඟ ගිවිසුම් ගත වීමට කටයුත් කිරීම බව සඳහන් කරන ලදී.

<u>ගරු මන්ත්‍රී කේ. හැරිසෙන්ස් මැතිතුමා</u> වන ජීවී හා වන සංරක්ෂණයට අදාල පනත් කිහිපයක් උල්ලංඝනය කරමින් අදාල පස් කැපීමේ කාර්යය සිදු කරගෙන යන බවත්, අහලක් නිර්මාණය කිරීමට ප්‍රථම තිබූ අලි වැට තුලින් මේ වන විටත් අලින් ගමන් කරගෙන යන මුත්, අහල කැපීම තුලින් එය සම්පූර්ණයෙන්ම නතර වන බවත්, ඒ තුලින් අලින් වෙනත් ප්‍රදේශ කරා සංක්‍රමණය වීම අනිවාර්යෙන්ම සිදු වන බවත්, ඒ සම්බන්ධයෙන්ද අවධානය යොමු කල යුතු වන සේම අප මේ සඳහා වගකිව යුතු පුද්ගලයෙකු ලෙස රාජ්‍ය ආයතන සමඟ එක්වී නඩු පැවරීම සිදු කල හැකි මුත් එහි ප්‍රධානීන්ගේ පවතින නිහඬතාවය තුල දීර්ඝ කාලීන ගැටළුව තව දුරටත් වර්ධනය වී ඇති බව සඳහන් කරන ලදී.

තවද සභා කටයුතු සම්බන්ධයෙන් යම් ප්‍රගතියක් වාර්තා කිරීමට කටයුතු කරන්නේ නම් වඩාත් සුදුස බව සඳහන් කරන ලදී.

ගරු මන්ත්‍රී කේ.ඒ සංජීව මැතිතුමා මෙහි පරිසර හානිය වලක්වා ගැනීමට කටයුතු කල මුත් ව්‍යාපෘතිය සම්පූර්ණයෙන්ම නතර කිරීම සඳහා පියවර ගත යුතු බවත්, විධිමත් කිරීම සඳහා පමණක් අප පියවර ගත යුතු බව සඳහන් කරන ලදී.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා බල ප්‍රදේශයේ ජනතාවගේ සුභ සිද්ධිය උදෙසා තීන්දු තීරණ ගැනීම වෙනුවෙන් ගෞරවයෙන් සහයෝගය දැක්වූ ගරු මන්ත්‍රීතුමන්ලා වෙත හා ගරු මන්ත්‍රීතුමියන්ලා වෙත ස්තූතිය ප්‍රකාශ කරමින් 2021.12.21 වන දින පැවැත්වූ මහ සභා රැස්වීම ප.ව 01.40 ට අවසන් කරන ලද අතර එළඹෙන මහ සභාව 2022.01.18 වන දින පෙ.ව 10.00 පැවැත්වෙන බව සඳහන් කරන ලදී.

| | |
|---|---|
| .................................... | .......................................... |
| බී.එච් ප්‍රදීප් නිශාන්ත, | එස්.බී කුමාරදාස, |
| ලේකම්, | සභාපති , |
| නැ.නු.ප ප්‍රාදේශීය සභාව, | නැ.නු.ප්‍රාදේශීය සභාව, |
| විජයපුර. | විජයපුර. |